# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
# சுதேச வைத்திய நிறுவகம்
# INSTITUTE OF INDIGENOUS MEDICINE

## කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව
## கொழும்புப் பல்கலைக் கழகம் இலங்கை
## UNIVERSITY OF COLOMBO, SRI LANKA

# වාර්ෂික වාර්තාව
# ஆண்ட றிக்கை
# ANNUAL REPORT
# 2012

# දැක්ම

ආයුර්වේද, යුනානි සහ දේශීය වෛද්‍ය
ක්‍රමයන් පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර
වශයෙන් පිළිගත් ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම
ආයතනය බවට පත්වීම.

# මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආයුර්වේද, යුනානි සහ
දේශීය වෛද්‍ය ක්‍රමයන්හි උන්නතිය
සඳහා අවශ්‍ය දැනුම ව්‍යාප්ත කිරීමට සහ
වර්ධනය කිරීමට අදාල වන අධ්‍යයන සහ
පර්යේෂණ කටයුතු පැවැත්වීම.

# ආයතනයේ සංවිධාන ව්‍යුහය



## අධ්‍යක්ෂවරයාගේ වාර්තාව

2012 වර්ෂය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නට ලැබීම ඉමහත් සතුටක් කොට සළකමි. ශ්‍රී ලංකාවේ දේශිය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මූලික හා පශ්චාත් උපාධි පාඨමාලා පිරිනමන මෙම ආයතනය එම අංශයෙහි මෙරට ඇති ප්‍රධානම විශ්ව විද්‍යාලයානුබද්ධ ආයතනයකි. 1979 දී කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ වීමෙන් පසු දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය මගින් උපාධි ප්‍රදානය කෙරුණු ශිෂ්‍ය සංඛ්‍යාව 1800 ක් වෙයි.

2020 වසරේ දී ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනයේ ජාත්‍යන්තර කේන්ද්‍රය බවට පත් කිරීමේ රජයේ දැක්මට අනුරූපව යාමේ දී මතුවන අභියෝගයන් ජය ගනිමින් සැළසුම් සහගත ව්‍යාපෘතීන් රැසක් නිමකිරීමටත්, තවත් ව්‍යාපෘතීන් රැසක් ඇරඹීම හෝ සැළසුම් කිරීමටත් 2012 වසරේ දී මෙම ආයතනයට හැකිවිය. හත්සියකටත් ආසන්න වූ ශිෂ්‍ය ප්‍රජාවකට ගැළපෙන ලෙස අධ්‍යයන කටයුතු කාලානුරූපව යාවත්කාලීනව කිරීමත්, ජාත්‍යන්තර මට්ටමට ගැළපීමේදී විශ්වවිද්‍යාලයකට අත්‍යාවශ්‍යයෙන්ම අවශ්‍යවන්නා වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, මෙම ආයතනයෙන් පිටව යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා රැකියා අවස්ථා සුලභ වන පරිදි පාඨමාලා සැකසීම හැරුණු කොට පෞද්ගලික අංශයේ හා පොදු අංශයේ ආයතන සමඟ මනා සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමටත් පිළිබඳව වූ මූලික අඩිතාලම දැමීමට 2012 වසර යොදාගන්නා ලදී. 2012 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා අධ්‍යාපනය සඳහා ඇතුළත් වන්නා වූ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම පිළිබඳව වැදගත් වූ කරුණු කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. එනම් මූලික උපාධි පාඨමාලා සඳහා මෙතෙක් බඳවා ගන්නා ලද සිසුන් ප්‍රමාණය 2012 වසරේ දී වැඩි කරන ලද අතර, ආයුර්වේද හා යුනානි අංශයන්හි වැඩි දුර අධ්‍යයනයන් කිරීම පිණිස ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලාවක් ද සක්‍රියව පවත්වා ගෙන යන ලදී.

ප්‍රථම වරට ශ්‍රී ලංකාව තුළදීම ආයුර්වේද හා දේශිය වෛද්‍ය විද්‍යාව සම්බන්ධ ආයුර්වේද විශාරද (MD) පාඨමාලාවක් 2012 මැයි මස 21 දින ආරම්භ කිරීමට ලැබීම ද 2012 වසරේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය අත්පත් කර ගත් සුවිශේෂී වූ ජයග්‍රහණයකි. දැනට ආයුර්වේද වෘත්තිකයන් විසි දෙනෙකු මෙම පාඨමාලාව හදාරති.

දකුණු ආසියාතික මට්ටමින් හා ජාත්‍යන්තර මට්ටමින් කොළඹ විශ්වවිද්‍යාලය අත්පත් කර ගත් ස්ථානය වඩාත් තහවුරු කිරීම පිණිස, ඒ යටතේ පවත්නා ආයතනයක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයටත් යම් වගකීමක් පැවරී ඇති බැව් අප තරයේම විශ්වාස කරමු. ජාත්‍යන්තර මට්ටමේ සබඳතා තහවුරු කිරීම මඟින් හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල කිහිපයක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගැනීම මඟින් 2012 වසරේ දී ඉදිරි පියවර කිහිපයක්ම ගැනීමට හැකිවිය. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයෙහි වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම මඟින් මෙහි පැවැත්වෙන පාඨමාලා පිළිබඳව හා සමස්ත වශයෙන් දේශීය වෛද්‍ය ක්‍රමයන් පිළිබඳ ජාත්‍යන්තරය දැනුවත් කිරීමටත් පියවර ගන්නා ලදී. යටිතල පහසුකම් අතින් තදබලම අවශ්‍යව තිබූ කාන්තා නේවාසිකාගාර වල අවශ්‍යම වූ අළුත් වැඩියාත් කර ඉතාමත්ම ප්‍රසන්න මට්ටමට පත්කොට ඇති අතර, අයහපත් තත්වයේ තිබූ පුස්තකාලය, දේශන ශාලා කිහිපයක්, ආචාර්යවරුන්ගේ කාර්යාල පරිපාලන හා මූල්‍ය අංශයේ කාර්යාල ඉඩකඩ නිසි පරිදි අළුත් වැඩියා කොට උසස් විශ්වවිද්‍යාලයකට ඔබින මට්ටමකට පත් කිරීමට 2012 වසරේ දී හැකිවිය. දැඩි ලෙස අවශ්‍යව ඇති පිරිමි නේවාසිකාගාරය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා ශිෂ්‍යයන් සඳහා දැඩි ලෙස අවශ්‍යව ඇති ක්‍රීඩා භූමියක් සැකසීම අවශ්‍ය වුවත් ප්‍රතිපාදන නොලැබීම නිසා 2012 වසරේ දී කිරීමට අපහසු විය.

මෙම සියළු කාර්යයන් කිරීමේදී කැපවීමෙන් කටයුතු කළ නියෝජ්‍ය ලේඛකාධිකාරී ඇතුළු පරිපාලන කාර්ය මණ්ඩලයට නියෝජ්‍ය මුල්‍යාධිකාරී ඇතුළු මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයත් ආයුර්වේද හා යුනානි අංශ ප්‍රධානින් ඇතුළු සියළුම ආචාර්ය මණ්ඩල සාමාජිකයන්ටත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් මාගේ ස්තූතිය පළ කරනු කැමැත්තෙමි. එසේම නිසි මග පෙන්වීම කළ ආයතනයේ කළමණාකරන මණ්ඩලයට හා මෙම සෑම කටයුත්තකදීම කාර්ය මණ්ඩලය හා සහයෝගීව කටයුතු කළ ශිෂ්‍ය ප්‍රජාවට ද මාගේ ස්තූතිය පුද කරමි.

තවද ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා ඇතුළු එම අමාත්‍යාංශයටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු එම කොමිසමටත් කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමිය ඇතුළු එම විශ්වවිද්‍යාලයටත් 2012 වර්ෂයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වැඩ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා දක්වන ලද සහයෝගයට කෘතඥතා පූර්වක ස්තූතිය මෙයින් පිරිනමමි.

සුනිමල් සේනාරත්න
අධ්‍යක්ෂ

| පටුන | පිටු අංකය |
|---|---|


**1. පරිපාලන ව්‍යුහය**

| | |
|---|---|
| 1.1 අධ්‍යක්ෂවරයා | 1 |
| 1.2 කළමනාකරණ මණ්ඩලය | 1 |
| 1.3 අධ්‍යයන කමිටු | 3 |
| 1.3(1) ආයුර්වේද අංශීය කමිටුව | 3 |
| 1.3(2) යුනානි අංශීය කමිටුව | 3 |
| 1.3(3) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව (RHDC) | 3 |

**2. අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන සහ ඒකක**

| | |
|---|---|
| 2.1 ආයුර්වේද අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු | 4 |
| 2.2 යුනානි අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු | 4 |
| 2.3 පුස්තකාලය | 5 |

**3. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳ සමාලෝචනයක්**

| | |
|---|---|
| 3.1 උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රවේශය | 5 |
| 3.2 BAMS සහ BUMS උපාධි පාඨමාලා පිළිබඳ විස්තර | 6 |
| 3.3 ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 6 |
| 3.4 ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි වැඩසටහන් | 7 |
| 3.5 අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 7 |
| 3.6 පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 8 |
| 3.7 ජාතික සහ ජාත්‍යන්තර තලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය | 9 |
| 3.8 පර්යේෂණ,නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 10 |
| 3.9 දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශ්‍රී ලාංකේය වාර ප්‍රකාශනය (SLJIM)-2012 | 14 |
| 3.10 වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 15 |
| 3.11 ශිෂ්‍ය සුභසාධන | 15 |
| 3.12 ආයුර්වේද ශික්ෂණ රෝහල | 16 |
| 3.13 යටිතල පහසුකම් සංවර්ධනය | 17 |

| | |
|---|---|
| **4. ජාත්‍යන්තර සබඳතා** | 18 |

**5. මූල්‍යය සහ ගිණුම්**

| | |
|---|---|
| 5.1 මූල්‍ය සමාලෝචන | 18 |
| 5.2 අවසන් ගිණුම් - 2012 | 21-48 |
| 5.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | 49-60 |
| 5.4 විගණකාධිපති නිරීක්ෂණ වාර්තාව | 61-64 |

## 01. පරිපාලන ව්‍යුහය

### 1.1 අධ්‍යක්ෂවරයා

හිටපු අධ්‍යක්ෂ වෛද්‍ය ආර්.ඒ. ජයසිංහ මහතා සිය තනතුරෙන් ඉල්ලා අස්වීම නිසා පුරප්පාඩු වූ අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිවරයෙක් ලෙස කටයුතු කර විශ්‍රාම ලැබූ සුනිමල් සේනාරත්න මහතා 2012.04.17 දින අධ්‍යක්ෂ තනතුරේ වැඩ භාර ගත්තේය. රාජ්‍ය සේවයේ විවිධ තනතුරු හොබවමින් අවසානයේ අමාත්‍යංශ ලේකම්වරයෙකු ලෙස කටයුතු කර ඇති එතුමාගේ පැමිණීමත් සමග දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය, ඖෂධාගාර පරීක්ෂණ සඳහා අවශ්‍ය උපකරන සැපයීම, නේවාසිකාගාර අළුත්වැඩියාව ඇතුළු අධ්‍යයන, පර්යේෂණ සහ ශිෂ්‍ය සුභසාධන කටයුතුවල විශාල පරිවර්තනයක් පසුගිය වසර තුල (2012) සිදු වී ඇත.

### 1.2 කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පත් කොට ඇත්තේ 1979 අංක 7 දරණ දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියේ 10(1) ඡේදයේ ප්‍රතිපාදනයන්ට අනුකූලවය. කළමනාකරණ මණ්ඩලය අධ්‍යක්ෂවරයෙකු (නිල බලයෙන් සභාපති ලෙස) සහ පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ. එය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වේ.

(අ) අධ්‍යක්ෂකවරයා

(ආ) උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ පත් කළ නාමිකයෙකු

(ඇ) සෞඛ්‍ය විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ පත් කළ නාමිකයෙකු

(ඈ) ආයුර්වේද කොමසාරිස්

(ඉ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ඊ) මධ්‍යම ආයුර්වේද රෝහලේ වෛද්‍ය අධිකාරිවරයා

(උ) කොළඹ විශ්ව විද්‍යාලයීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති

(ඌ) ආයතනයේ එක් එක් අධ්‍යනාංශ ප්‍රධානීන්

එසේම පහත සඳහන් පරිදි සාමාජිකයින්ද කළමනාකරන මණ්ඩලයට තෝරා පත්කර ගැනේ.

(අ) කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් එහි සාමාජිකයන් අතරින් තෝරා පත් කරගත් සාමාජිකයන් තිදෙනෙක්

(ආ) ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ස්වකීය සාමාජිකයන් අතුරින් පත් කරගත් එක් සාමාජිකයෙකු

(ඇ) සංස්කෘතික, අධ්‍යාපනික, වෘත්තිය හෝ පරිපාලන විෂයයෙහි අප්‍රකට සේවාවක් විදහාපාන ලද පුද්ගලයන් අතුරින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන සභාව විසින් පත් කරන ලද සාමාජිකයන් අට දෙනෙකු ඒ අතුරින් එසේ පත් කරගත් සාමාජිකයන් පස් දෙනෙකු පාරම්පරික වෛද්‍ය වෘත්තියේ සාමාජිකයන් අතුරින් විය යුතුය.

අධ්‍යක්ෂක (සභාපති)
වෛද්‍ය ආර්. ඒ. ජයසිංහ මහතා 2012.04.16 දක්වා
සුනිමල් සේනාරත්න මහතා 2012.04.17 සිට මේ දක්වා

අංශ ප්‍රධාන/ආයුර්වේද
වෛද්‍ය ටී. ඩී. එන්. කරුණාරත්න මහතා

අංශ ප්‍රධාන/යුනානි
ආචාර්ය බී. එම්. නජීබ් මහතා

අතිරේක ලේකම්/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
පී. ජී. ජයසිංහ මහතා

අතිරේක ලේකම්/සෞඛ්‍ය අමාත්‍යාංශය
සෝමරත්න විදානපතිරණ මහතා

නියෝජ්‍ය ලේකම්/මහා භාණ්ඩාගාරය
පී. ඒ. අබේසේකර මහතා

ආයුර්වේද කොමසාරිස්
පී. එස්. කේ. ආර්. වීරකෝන් මහතා

අධ්‍යක්ෂ/බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය
මහාචාර්ය කේ. කේ. ඩී. එස්. රණවීර මහතා

අධ්‍යක්ෂ /ආයුර්වේද ශික්ෂණ රෝහල
වෛද්‍ය ඩී. එච්. තෙන්නකෝන් මහතා

පීඨාධිපති - වෛද්‍ය පීඨය
මහාචාර්ය රොහාන් ඩබ්ලිව්. ජයසේකර මහතා,

වෛද්‍ය පීඨ සාමාජිකයන්
වෛද්‍ය ක්‍රිශාන්ත වීරසිංහ මහතා

වෛද්‍ය පණ්ඩුක කරුණානායක මහතා
වෛද්‍ය චමරි වීරරත්න මහත්මිය

**ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික**

වෛද්‍ය එස්. එම්. එච්. සේනබණ්ඩාර මහතා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කළ සාමාජිකයන්**

වෛද්‍ය ඒ. ජී. නිමල් ජයසිංහ මහතා

වෛද්‍ය සුනිල් අතපත්තු මහතා

වෛද්‍ය පී. එම්. චන්ද්‍රසිරි මහත්මිය

වෛද්‍ය ඒ. එම්. අබුතහිර් මහතා

වෛද්‍ය ඒ. පී. එස්. යූ. අතපත්තු මහතා

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා

ආර්. එච්. එම්. පියසේන මහතා

ලේකම් - නියෝජ්‍ය ලේඛකාධිකාරි
එල්. එල්. ඩබ්. පෙරේරා මහතා

**1.3 අධ්‍යයන කමිටු**

**1.3(1) ආයුර්වේද අංශීය කමිටුව**

දේශීය වෛද්‍ය විද්‍යාවේ අදාල ශාඛාවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග හා සම්බන්ධ සියළු කටයුතු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම අංශීය කමිටුව වෙත පවරා ඇත.

1979 අංක 7 දරණ දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියේ 15(1) ඡේදයට අනුකූලව පහත පරිදි 2010 අධ්‍යයන කමිටුව පත් කොට ඇත.

අංශ ප්‍රධාන (කමිටුවේ සභාපති)

වෛද්‍ය ටී. ඩී. එන්. කරුණාරත්න මහතා

සියලුම ස්ථිර කථිකාචාර්යවරුන් අංශීය කමිටුවේ සාමාජිකයන් වේ.

**1.3(2) යුනානි අංශීය කමිටුව**

අංශ ප්‍රධාන (කමිටුවේ සභාපති)

ආචාර්ය බී. එම්. නජීබ් මහතා

**1.3(3) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව (RHDC)**

අධ්‍යක්ෂ/සභාපති
අතිරේක අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි අංශය

අංශ ප්‍රධාන/ආයුර්වේද

අංශ ප්‍රධාන/යුනානි

ආයතනයේ සියළුම මහාචාර්යවරුන් සහ සහය මහාචාර්යවරුන්

ආයුර්වේද කොමසාරිස්

අධ්‍යක්ෂ - බණ්ඩාරණායක ආයුර්වේද පර්යේෂණ ආයතනය

අධ්‍යක්ෂ - ආයුර්වේද ශික්ෂණ රෝහල

මහාචාර්ය ඩබ්ලිව්. ඩී. රත්නසූරිය මහතා - විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය ස්වර්ණා පියසිරි මහත්මිය -පීඨාධිපති (පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

වෛද්‍ය ක්‍රිශාන්ත වීරසිංහ මහතා - වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

සම්බන්ධීකාරක - MD (ආයුර්වේද) පශ්චාත් උපාධි පාඨමාලාව

සම්බන්ධීකාරක /යුනානි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

සම්බන්ධීකාරක - ආයුර්වේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

නියෝජ්‍ය මූල්‍යාධිකාරි

නියෝජ්‍ය ලේඛකාධිකාරි /ලේකම්

**2. දෙපාර්තමේන්තු, මධ්‍යස්ථාන සහ ඒකක**

**2.1 ආයුර්වේද අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

ආයුර්වේද අංශය නම් වශයෙන් දෙපාර්තමේන්තු අටකින් (08) සමන්විත වේ.

I. මෞලික සිද්ධාන්ත (Maulika Siddhantha)
II. ද්‍රව්‍ය ගුණ විඥාන (Dravyaguna Vignana)
III. ස්වස්තවෘත්ත (Swasthavritta)
IV. කාය චිකිත්සා (Kaya Chikitsa)
V. දේශීය චිකිත්සා (Deshiya Chikitsa)
VI. ප්‍රසූතිතන්ත්‍ර කෞමාරභෘත්‍ය (Prasutitantra Kaumarabhritya)
VII. ශල්‍ය ශාලක්‍ය (Shalya Shalakya)
VIII. සමාන්තර විද්‍යා (Allied Science)

**2.2 යුනානි අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

යුනානි අංශය නම් වශයෙන් දෙපාර්තමේන්තු අටකින් (08) සමන්විත වේ.

I. කුල්ලියත් (Kulliat)
II. ඉල්මුල් අඩ්වියා (Ilmul Advia)
III. මෞලිජාත් (Moalejat)
IV. නිස්වාන් වා කබාලත් (Niswan va Quabalat)
V. ඉල්මුල් ජරාහත් (Ilmul Jarahat)
VI. හිෆ්සානේ සේහාත් (Hifzane Sehath)
VII. සමාන්තර විද්‍යා (Allied Science)
VIII. දේශීය ඉලාජ් (Deshiya Ilaj)

### 2.3 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පුස්තකාලයේ ඉතිහාසය 1929 දී දේශීය වෛද්‍ය විද්‍යාලය ආරම්භ කල අවධිය තෙක් දිවේ. පුස්තකාලය බැහැරදීමේ අංශය, විමර්ශණ අංශය, සඟරා අංශය, පර්යේෂණ අංශය, පැරණි පුස්කොල පොත් අංශය සහ පොත් බැඳුම් අංශය වශයෙන් අංශ හයකින් (06) සමන්විත වේ.

මෙම පුස්තකාලයේ 28930 පමණ පොත් එකතුවක් පවතින අතර එයට අමතරව ඉපැරණි වටිනා පුස්කොළ පොත්, වාර සඟරා, උපාධි නිබන්ධනවල එකතුවක්ද පවතී. මෙම එකතුවට වෛද්‍ය විද්‍යාව, දන්ත වෛද්‍ය විද්‍යාව, ඖෂධ වේදය, හෙදකම, ව්‍යවහාරික විද්‍යාව, කායික විද්‍යාව යන විෂයන්ද විශේෂයෙන් ආයුර්වේද හා යුනානි පොත්වල විශේෂ එකතුවක්ද පවතී. ඒවාට ආයුර්වේද ඖෂධ පැළෑටි, පුස්කොළ පොත් සහ අතින් ලියන ලද පොත්වල එකතුවක්ද ඇතුලත් වේ.

එසේම නූතන තාක්ෂණ දියුණුවත් සමග පුස්තකාලයද නවීකරණය කිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහ ඡායා පිටපත් පහසුකම් ඇති කර ඇත. 2012 වසරේදී රු.355802 ක වටිනා පොත් මිලදී ගෙන ඇති අතර 974 පොත් පරිත්‍යාග ලෙස ලැබී ඇත. පොත් 7723 බැහැරගෙන යාමේ සේවය යටතේද පොත් 3669 විමර්ෂණ යටතේද මෙම වසරේදී නිකුත් කර ඇත.

2012 වසරේ පුස්තකාලය සම්බන්ධයෙන් වූ විශේෂතම සිදු වීම වන්නේ නව අධ්‍යක්ෂවරයා විසින් පුස්තකාලයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ගනු ලැබූ කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ගයන්ය. ඒ අනුව පුස්තකාලයේ පැරණි සිවිලිම ඉවත්කර නව සිවිලිමක් සවිකිරීම, බිත්ති පිළිසකර කර තීන්ත ආලේප කිරීම, වායුසමීකරණ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය වෙනස්වීම් සිදුකිරීම ආදිය මගින් එය නවීකරණය කරන ලදී.

## 3. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳ සමාලෝචනයක්

### 3.1 උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම

ජීව විද්‍යා විෂය ධාරාවෙන් අ.පො.ස උසස් පෙළ විභාගය සමත්වන සිසුන්ගෙන් ආයුර්වේද වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යා (BAMS) සහ යුනානි වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යා (BUMS) පිළිබඳ උපාධි වැඩසටහන්වලට ඇතුළත් කර ගැනීමට අදාල තේරීම් කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. වැඩසටහන් දෙක සඳහාම වාර්ෂික ඇතුළත් කරගැනීම දළ වශයෙන් ශිෂ්‍යයන් දෙසියයක් (200)වේ.

2011 අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් 2012 වසරේ මෙම ආයතනයට ඇතුලත් කර ගැනීමට අපේක්ෂා කලද "Z", ලකුණු සම්බන්ධයෙන් පැවති ගැටළුකාරී තත්වය මත 2012 වසරේ සිසුන් ඇතුලත් කර ගැනීමක් සිදු නොවීය.

**2012 වසරේ ශිෂ්‍යයන්ගේ විස්තර**

ශිෂ්‍යයන්ගේ විස්තර

| අංශය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් කර ගැනීම් | 1 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 2 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 3 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 4 වන වර්ෂයේ ශිෂ්‍යයන් | අවසන් වර්ෂයේ ශිෂ්‍යයන් | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආයුර්වේද | බී.ඒ.එම්.එස් | සිංහල ඉංග්‍රීසි | | 147 | 110 | 92 | 80 | 43 | 58 |
| යුනානි | බී.යූ.එම්.එස් | දෙමළ ඉංග්‍රීසි | | 27 | 33 | 28 | 24 | 18 | 16 |
| එකතුව | | | | 174 | 143 | 120 | 104 | 61 | 74 |

"Z", ලකුණු පිළිබඳ ගැටළුව නිසා 2012 වර්ෂයේ නව ඇතුලත් කර ගැනීම් සිදු නොවූ අතර පසුගිය වසරවල ඇතුලත් කර ගත් සිසුන් පිළිබඳ විස්තර ඉහත දැක්වේ.

### 3.2 BAMS සහ BUMS උපාධි පාඨමාලා පිළිබඳ විස්තර

**ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව සහ යුනානි වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පාඨමාලාව**

මෙම පාඨමාලා වසර පහක (05) ආයතනික පුහුණුවකින්ද එක් වර්ෂයක ආධුනික වෛද්‍ය පුහුණුවකින්ද සමන්විත වේ. නව පාඨමාලාවේ ප්‍රධාන දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. දේශන කටයුතු ආයතනය තුළ පවත්වනු ලබන අතර සායනික අධ්‍යයන කටයුතු මූලිකව ආයුර්වේද ශික්ෂණ රෝහල ආශ්‍රිතව සිදු කෙරේ.

නව අධ්‍යයන පාඨමාලාව සෙමස්තර ක්‍රමය යටතේ සිදු වේ. එක් අධ්‍යයන වසරක් සෙමස්තර දෙකකින් සමන්විත වේ. එක් සෙමස්තරයකට සති 15ක් ඇතුලත් වේ. සෑම සෙමස්තරයක් අවසානයේම විභාගයක් පැවැත්වේ.

**ආයුර්වේද සහ යුනානි වෛද්‍ය උපාධි පාඨමාලාවන්හි අරමුණු සහ පරමාර්ථ**

1. ආයුර්වේද සහ යුනානි වෛද්‍ය ක්‍රමයන් පිළිබඳ වර්තමාන සමාජ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි හසල දැනුමක් හා දක්ෂතාවයන් ඇති වෛද්‍යවරුන් බිහි කිරීම
2. මූලික සෞඛ්‍ය සංරක්ෂණයේ වගකීම දැරිය හැකි වීම
3. දේශීය ඖෂධ සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට හැකි වීම
4. යහපත් සෞඛ්‍ය තත්වයක් පවත්වාගෙන යාම සඳහා සරල ඖෂධ හා ප්‍රතිකාර ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් මහජනතාවට ලබා දීමේ හැකියාවක් ජනිත වීම
5. ඉපැරණි වෛද්‍ය ඥානය උද්දීපනය කල හැකි වීම
6. ආයුර්වේද සහ යුනානි වෛද්‍ය ක්‍රම පිළිබඳ පර්යේෂණ කළ හැකි එමගින් වෛද්‍ය ක්ෂේත්‍රයට නව අත්දැකීම් එක් කළ හැකි උගත් වෛද්‍යවරුන් බිහි කිරීම
7. ඉදිරි ආයුර්වේද හා යුනානි වෛද්‍ය ජන සමාජය පුහුණුකිරීමේ වගකීම දැරිය හැකි දක්ෂ ආචාර්යවරුන් බිහි කිරීම
8. ආයුර්වේද සහ යුනානි ක්ෂේත්‍රයට අදාල සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීම

### 3.3 ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (භෛෂජ්‍ය පාඨමාලාව)

දෙවසරක පාඨමාලාවක් වන මෙමගින් රජයේ සහ පෞද්ගලික අංශයේ ආයුර්වේද ඖෂධවේදීන් විධිමත් ලෙස පුහුණු කිරීම සිදු වේ. එමගින් ඔවුන්ට දේශීය ඖෂධ වර්ග හඳුනා ගැනීම ඒවායේ ගුණාත්මකභාවය සහ භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා දීම සිදු වේ. සතියේ සෙනසුරාදා දිනවල මෙහි න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ලබා දෙන අතර ක්ෂේත්‍ර අධ්‍යයනයන් හල්දුමුල්ල ජාතික ඔසු උයනේදී සිදු කෙරේ. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය මගින් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස ඉටු කරනු ලබන කාර්යන්ගෙන් එක් කාර්යයක් ලෙස මෙම පාඨමාලාව හැඳින්විය හැකිය.

**ආයුර්වේද පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව**

ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ නියුතු වෛද්‍යවරුන්ගේ න්‍යායික හා ප්‍රායෝගික දැනුම වැඩිදියුණු කිරීම සඳහා මෙම මාස පහළොවක (15) පාඨමාලාව මෙම ආයතනය විසින් පවත්වනු ලැබේ. එහිදී න්‍යායික ප්‍රායෝගික හා සායනික පුහුණුව ලබා දීම සිදු වේ. පූර්ණකාලීන පාඨමාලාවක් වන මේ සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ සහ පළාත් සභා යටතේ සේවය කරන ආයුර්වේද වෛද්‍යවරුන්ට වැටුප් සහිත නිවාඩු ලබා දීම එම ආයතනවලින් සිදු කරන අතර මෙම පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලබා ගැනීම ඔවුන්ගේ උසස්වීම් සඳහා අනිවාර්ය කර ඇත. ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් සහ කැපවීමෙන් මෙම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලැබේ.

**ආයුර්වේද වෛද්‍යපති MD(AYU) පශ්චාත් උපාධි වැඩසටහන**

ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ දිගුකාලයක් පැවති අඩුපාඩුවක් සම්පූර්ණ කරමින් 2012 වර්ෂයේ MD(AYU) පශ්චාත් උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට හැකිවීම දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ විශේෂතම සිදුවීමක් වේ. ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට ආර්මිභ කරන ලද මෙම පාඨමාලාවෙන් මෙතෙක් විදේශීය රටවල පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා පිටව ගිය උපාධිධාරීන්ට මෙරට තුලම අදාල විශේෂඥ පුහුණුව ලබා දීමට හැකි වී තිබෙන අතර එමගින් පිටරටටඇදී ගිය විශාල විදේශවිනිමය ප්‍රමාණයක් මෙරට තුලම රඳවා ගැනීමට හැකිව තිබේ. මෙම ප්‍රථම පාඨමාලාව සඳහා සිසුන් 20 දෙනෙකු තෝරා ගෙන ඇත. වසර 03 ක පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. ප්‍රථමවසර දේශන සහ පර්යේෂණ සඳහා සූදානම් වීමද ඉතිරි දෙවසර තුළදී මාස 06 ක විදේශීය විශ්වවිද්‍යාලයක සායනික හා පර්යේෂණ පුහුණුවද පසුව දේශීය වශයෙන් සායනික හා පර්යේෂණ කටයුතුවල යෙදීමද අනිවාර්ය වේ. ලිඛිත පරීක්ෂණ, වාචික සහ ප්‍රායෝගික, නිබන්ධන සහ ඉදිරිපත් කිරීමේ පරීක්ෂණ මගින් ඇගයීම් සිදු කෙරේ.

**3.4 ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි වැඩ සටහන්**

| වැඩසටහනේ නම | ශිෂ්‍යයන් සංඛ්‍යාව | මාධ්‍යය |
|---|---|---|
| ආයුර්වේද පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 20 | ඉංග්‍රීසි |
| ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 45 | සිංහල |
| ආයුර්වේද වෛද්‍යපති MD(Ayu) පශ්චාත් උපාධි වැඩසටහන | 20 | ඉංග්‍රීසි |

සමාලෝචනයට බඳුන් වන වර්ෂයේදී ඉහත පාඨමාලා සාර්ථකව පවත්වන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ඉතිහාසයේ ප්‍රථමවරට ආයුර්වේද වෛද්‍ය MD(Ayu) පාඨමාලාව ආරම්භ කිරීමට හැකි වූ අතර එමගින් මෙතෙක් පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා විදේශගත වූ ආයුර්වේද කථිකාචාර්යවරුන් සහ වෛද්‍යවරුන් සංඛාව අඩු කිරීමට හැකි වීම 2012 වසරේ විශේෂතම සිදු වීමක් වේ.

එසේම 2012 වර්ෂයේදී ආයතනයේ අධ්‍යයන කටයුතුවලට දායක වීම පශ්චාත් උපාධි අංශය විසින් දිගටම කරගෙන යන ලදී.

**3.5 අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර**

| අංශය | මාධ්‍යය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) |
|---|---|---|---|---|---|
| ආයුර්වේද | සිංහල/ඉංග්‍රීසි | 02 | 22 | 06 | 16 |
| යුනානි | දෙමළ/ඉංග්‍රීසි | - | 14 | 01 | 06 |
| එකතුව | | 02 | 36 | 07 | 22 |

මහාචාර්යවරුන් දෙදෙනෙකු (2) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිස්හය දෙනෙකු (36), සහ කථිකාචාර්යවරුන් 07 දෙනෙකු සහ පරිවාස කථිකාචාර්යවරුන් 22 දෙනෙකද පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති සහ සහකාර පුස්තකාලයාධිපති ඇතුළු ආයුර්වේද සහ යුනානි අංශයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 69 න් සමන්විත වේ.

### අධ්‍යයන කාර්ය මණ්ඩලය (ආයුර්වේද සහ යුනානි)




### 3.6 පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 01 |
| නියෝජ්‍ය මුල්‍යාධිකාරි | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 01 |
| සහකාර මුල්‍යාධිකාරි | 01 |
| සහකාර ලේඛකාධිකාරි | 02 |
| එකතුව | 06 |

නියෝජ්‍ය ලේඛකාධිකාරි විභාග අංශය සහ ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි අධ්‍යයන සහ අනධ්‍යයන ආයතන අංශය භාරව කටයුතු කරයි. එසේම සහකාර ලේඛකාධිකාරි/පාලන සාමාන්‍ය පාලන අංශයද සහකාර ලේඛකාධිකාරි/මූලධන සහ ශිෂ්‍ය සේවා, මූලධන සහ ශිෂ්‍ය සේවා කටයුතු භාරව කටයුතු කරයි. නියෝජ්‍ය මුල්‍යාධිකාරි සැපයීම් සහ ආයතනයේ මුල්‍ය පාලනයද සහකාර මුල්‍යාධිකාරි විසින් වැටුප් සහ ගෙවීම් පිළිබඳවද කටයුතු කරයි.

එසේම පුස්තකාලයේ පරිපාලනය සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී සහ සහකාර පුස්තකාලයාධිකාරි වශයෙන් පුස්තකාලයාධිකාරීවරියන් දෙදෙනෙකු කටයුතු කරන අතර ඔවුන් යටතේ පුස්තකාලය සහ එහි විවිධ අංශ පාලනය සිදු කෙරේ.

**අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර**

| ශාඛා/අංශ | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|
| අධ්‍යක්ෂ කාර්යාලය | - | - | 01 |
| පාලන අංශය | 02 | 04 | 11 |
| ආයතන අංශය | 01 | 02 | - |
| විභාග අංශය | 01 | 05 | 01 |
| මූලධන හා ශිෂ්‍ය සුහසාධන අංශය | - | 02 | - |
| ගිණුම් අංශය | 03 | 04 | 01 |
| ආයුර්වේද අංශය | 03 | 05 | 09 |
| යුනානි අංශය | 01 | 01 | 02 |
| පශ්චාත් උපාධි අංශය | 01 | 01 | 01 |
| පුස්තකාලය | 01 | 05 | 03 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය | 01 | 01 | 02 |
| එකතුව | 14 | 30 | 31 |

මුළු සාමාජික සංඛ්‍යාව 75 ක් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, කළමනාකාර සහායක, තාක්ෂණික සහ තාක්ෂණික නොවන, පුහුණු අර්ධ පුහුණු සහ නුපුහුණු කාර්ය මණ්ඩලය ලෙස පරිපාලන අංශ, අධ්‍යනාංශ, නඩත්තු සහ උද්‍යාන අංශ යටතේ සේවය කරයි.

ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ.

**3.7 ජාතික හා ජාත්‍යන්තරතලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය**

1. 2012 පෙබරවාරි මස අනුරාධපුරයේදී පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය සහභාගි වූ අතර එහිදී ආයුර්වේද වෛද්‍ය ප්‍රදර්ශනයක් සහ ප්‍රදර්ශනයට පැමිණි මහජනතාව වෙනුවෙන් ආයුර්වේද ජංගම සායනයක් පවත්වන ලදී.

2. 2012 අනුරාධපුරයේදී පැවති පොසොන් උත්සවය සඳහා ආයතනය විසින් රුවන්වැලි සෑය අසල ආයුර්වේද ජංගම සායනයක් පවත්වන ලද අතර එහිදී 2000 පමණ බැතිමතුන් පිරිසකට දින 03 ක් තුලදී මූලික ආයුර්වේද ප්‍රතිකාර ලබා දීමට හැකි විය.

3. 2012 ජුනි මස ත්‍රිකුණාමලයේ අග්බෝපුර පැවති ආයුර්වේද ජංගම සායනය මගින් එම ප්‍රදේශයේ ජනතාව අතර ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම පිළිබඳ අවබෝධයක් ලබා දීමට හැකි වූ අතර විවිධ රෝග සඳහා ආයුර්වේද ප්‍රතිකාර ලබා දීමද සිදු විය.

4. එසේම තෝරාගත් පාසල් කිහිපයක ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

5. ජාත්‍යන්තර වශයෙන් පැවති ආයුර්වේද සම්මන්ත්‍රණ වැඩමුළු සහ සාකච්ඡා සඳහා අධ්‍යන කාර්ය මණ්ඩලයේ දායකත්වය ඉතා ඉහළ මට්ටමක පැවතුනි.

**3.8 පර්යේෂණ,නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර**

| විෂයය | ප්‍රකාශයට පත් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | 25 | 14 |
| නව සොයා ගැනීම් | 01 | |
| ජර්නල් සංඛ්‍යාව | 01 | |
| පොත් සංඛ්‍යාව | | |
| ලිපි සංඛ්‍යාව | 02 | |
| වෙනත් | | |
| එකතුව | 29 | 14 |

**පර්යේෂණ ප්‍රකාශන - ආයුර්වේද අංශය - 2012**

- **මහාචාර්ය ඒ.පී.ජී. අමරසිංහ**

1. ඩබ්.ඒ.එස්. සරෝජා වීරකෝන්, ඒ.පී.ජී. අමරසිංහ "මාංශගත වාත රෝගය සඳහා ආයුර්වේද ප්‍රතිකාර පද්ධතියක ක්‍රියාකාරිත්වය අධ්‍යයනය" ජාතික ආයුර්වේද පර්යේෂණ සමුළුව 2012, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකාව. පිටුව 46

2. බී.එම්. නජීබ්, ඒ.පී.ජී. අමරසිංහ සහ එස්. විදානපතිරණ " ආයුර්වේද ඖෂධ සංයෝග කීපයක ව්‍යාධිජනක කෝලිෆෝම් සහ සැල්මොනෙල්ලා බැක්ටීරියා තිබේදැයි අධ්‍යයනය කිරීම" ජ්ලාන්ටා මෙඩිකා 2012,78. පිටුව 106

3. බී.ඩබ්. පද්මශාන්ති, ඒ.පී.ජී. අමරසිංහ "රතගාය චර්ම රෝගය සඳහා රතකල්කයේ සාඵල්‍යතාව අධ්‍යයනය කිරීම" දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ශ්‍රී ලාංකේය වාර ප්‍රකාශනය 2012;02(01)
පිටු අංක 107-111

4. කේ. ඒ. ගුණවර්ධන, කේ.කේ.ඩී.එස්. රණවීර, ඒ.බී.නවරත්න ඒ.පී.ජී. අමරසිංහ "ඇඹුල් ඇඹිලිය තැම්බුම් හොද්ද විද්‍යාත්මක නිර්මාණය" වික්‍රමාරච්චි අනුස්මරණ පර්යේෂණ සමුළුව 2012 නොවැම්බර් 7-9 පිටුව 117

5. ඒ.පී.ජී. ජයසිරි, එස්.පී. සේනානායක, පී. පරණගම, ඒ.පී.ජී. අමරසිංහ "ආයුර්වේද ඖෂධ සඳහා භාවිතා කරන සිරිස ශාඛය සහ ප්‍රතිනිය ශාඛවල වර්ගීකරණය සහ ශාඛ රසායන විද්‍යාත්මක අධ්‍යයනය" 13 වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව,කැලණිය විශ්වවිද්‍යාලය 2012නොවැම්බර් 22-23
පිටු අංක 72-73

- **මහාචාර්ය ඊ.ආර්. එච්.එස්.එස්. එදිරිවීර**

1. අබිං ඖෂධයක් ලෙස ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමයේ යෙදන අන්දම පිටු අංකය 08
   ජාතික ආයුර්වේද පර්යේෂණ සමුළුව- බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය,නාවින්න, ශ්‍රී ලංකාව

2. ලංකාවේ භාවිතාවන පලතුරුවල පෝෂණ ගුණය පිටු අංක 40
   වික්‍රමාරච්චි අනුස්මරණ පර්යේෂණ සමුළුව,ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය 2012

3. කුරුළෑ රෝගය සඳහා ලෝධ්‍රාදිලේපයයේ සාඵල්‍යතාවය  පිටු අංකය 43
   වික්‍රමාරච්චි අනුස්මරණ පර්යේෂණ සමුළුව,ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය 2012

4. මී පැණිවල ඖෂධීමය යෙදුම් සහ රූපලාවන්‍ය සඳහා යෙදුම්
   ආයුර්වේද සඟරාව - වෙළුම 33 අංක 02 - 2012

- **වෛද්‍ය පී.කේ. පෙරේරා**

1. ක්ලෙමටිස් ඖෂධීය ශාඛයේ වේදනා ස්ථාපනය පිළිබඳ පර්යේෂණය
   වාතරක්තය පිළිබඳ ජාත්‍යන්තර සඟරාව 2012 පිටුව 32

2. දියවැඩියා රෝගයට ක්‍රියාකාරි ආහාරවල බලපෑම
   www.phcogrev.com

3. අස්ථිභග්න සඳහාවන ඖෂධ පිළිබඳ පැතිකඩ පරීක්ෂාව, ඖෂධ පැළෑටි සහ ශාඛ නිෂ්පාදන
   පිළිබඳ 4 වන ජාත්‍යන්තර සමුළුව, 2012 ඇමෙරිකා එක්සත් ජනපදය

4. ශාඛමය ඖෂධවල ප්‍රතිආතරයිටිස් හැකියාව, ඖෂධ පැළෑටි සහ ශාඛ නිෂ්පාදන
   පිළිබඳ 4 වන ජාත්‍යන්තර සමුළුව, 2012 ඇමෙරිකා එක්සත් ජනපදය

5. YJB ඖෂධයේ මැක්රෝ ෆේජ්ස් හා සයිනොවියොසිටිස්වලට වන බලපෑම
   ප්ලාන්ට මෙඩිකා සඟරාව 2012;(5);78

6. ශ්‍රී ලංකාවේ ශාකමය ඖෂධවල වර්තමාන තත්වය, ඖෂධ පැළෑටි සහ ශාඛ නිෂ්පාදන
   පිළිබඳ 4 වන ජාත්‍යන්තර සමුළුව, 2012 ඇමෙරිකා එක්සත් ජනපදය

7. පුද්ගල සංවර්ධනය හා මානසික සංවර්ධනය පිළිබඳව ආයුර්වේද පැතිකඩ
   මානව හා සමාජ විද්‍යා පිළිබඳ 5 වන වාර්ෂික සමුළුව, 2012, ශ්‍රී ලංකාව

8. ඖෂධීය ශාඛයන්හි ව්‍යාධික්ෂමතාව සඳහා හා ආතරයිටිස් සඳහා වන බලපෑම, ජනවාරි 2012
   ජාතික ආයුර්වේද පරීක්ෂණ සමුළුව- බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය,නාවින්න,
   ශ්‍රී ලංකාව

**පර්යේෂණ ප්‍රකාශන  - යුනානි අංශය - 2012**

**පෝස්ටර ඉදිරිපත් කිරීම්**

**වෛද්‍ය එම්.එස්. නස්මීර්**

1. යුනානි වෛද්‍ය ක්‍රමයේ භාවිතාවන රුධිරයේ සීනි මට්ටම පලනය කරන ඖෂධ පිළිබඳ විමර්ශනය
Intergrative Medicine & 1st SAARC Conference on Unani Medicine, 2010 AMU 1, ජාත්‍යන්තර සම්මන්ත්‍රණය,අලිගාර්, ඉන්දියාව

**වාචික ඉදිරිපත් කිරීම්**

පර්යේෂණාත්මකව ඇති කරන ලද මධුමේහය සඳහා Pakhanbed(Bergenia ligulata(wall)Engl ඖෂධයේ රුධිරගත සීනි මට්ටම පාලනය කිරීමේ හැකියාව ඇගයීම

3rd Indian National Seminar of Asian Network of Research on Antidiabetic Plants 2012 KG kar Medical College - කල්කටා,ඉන්දියාව

**වෛද්‍ය නසීම් පහමියා**

1. ඇතිකලි වෘක්ක විෂ තත්වය සඳහා Gentamicin මගින් Cucumis melo Linn ශාඛයේ මෙතනෝල් නිස්සාරකයේ වෘක්කා ආරක්ෂණ හැකියාව ඇගයීම
   ඖෂධ වර්ගීකරණය සහ පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර සඟරාව 2012 (පිටුව 40-53)

2. Althaea rosea Linu ශාඛයේ Pharmacognostical, Physicochemical & Phytochemical හැකියාව විමර්ශනය
   ඖෂධ පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සඟරාව 2012 (පිටුව 129-140)

3. Cucumis melolinu ශාඛයේ Pharmacoguostical අධ්‍යයනය හා එහි ප්‍රමිතිකරන පරාමිතීන් නිර්ණය කිරීම සඳහා අධ්‍යයනයක්
   Am.J Pharm Tech Research 2012(පිටුව 1-14)

4. Melissa Parviflora ශාඛයේ Pharmacoguostical හා Phytochemical අධ්‍යයනය හා එහි නිස්සාරකයේ HPTLC පරාමිතීන් පිළිබඳ අධ්‍යයනයක්
   J. Nat Product Plant Resources 2012(පිටුව 198-208)

5. යුනානි ඖෂධ සංයෝගයක Physicochemical හා Phytochemical අධ්‍යයනය
   ආයතනික ඖෂධවේද සහ ජීවන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සඟරාව 2012 (පිටුව 74-88)

6. ජානු සන්ධි ආශ්‍රිත Ostioarthritis සඳහා කුඩැල්ලන් භාවිතයෙන් රක්තමෝක්ෂණ ප්‍රතිකාරයේ යාන්ත්‍රණය හා එහි සාඵල්‍යතාව
   විශ්වීය ඖෂධවේදය සහ ජීවන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සඟරාව 2012 (පිටුව 40-49)

7. Rheum emodiwals ශාඛයේ Pharmacognostical සහ Phytochemical ඇගයීම

8. යුනානි ඖෂධ සංයෝගයක habbe-e azaragi හි නිෂ්පාදනය සහ Physicochemical analysis සහ Standered operating procedures භාවිතය
   ආයතනික ඖෂධවේදය සහ ජීවන විද්‍යාව පිළිබඳ සඟරාව 2012 (පිටුව 75-84)

## Paper Presentation

1. Free redical සහ හෘද රෝග ප්‍රගමනය සහ සංරක්ෂණය සඳහා යුනානි ඖෂධයන් පිළිබඳ විශේෂ අධ්‍යයනය
   යුනානි ඖෂධ පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය, හැම්ඩාඩ් විශ්වවිද්‍යාලය, ඉන්දියාව 2012 මාර්තු 06
2. Nephroprotectine ක්‍රියාවලිය සඳහා ඖෂධීය ශාඛයන්හි විභවතාවය අධ්‍යයනය
   ඖෂධමය පැළෑටි පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය, උද්භිද විද්‍යා අංශය, හැම්ඩාඩ් විශ්වවිද්‍යාලය, ඉන්දියාව
3. මී පැණි Proplietic medicine හි ප්‍රතිකාරමය ගුණාංග
   ඉස්ලාමීය ඖෂධ පිළිබඳ ප්‍රථම ජාත්‍යන්තර සමුළුව, හැම්ඩාඩ් විශ්වවිද්‍යාලය, ඉන්දියාව

**වෛද්‍ය එම්.එස්.එම් ෂිෆා**

1. යුනානි ඖෂධ සංයෝගයක Qurse mafasail වල Physiochemical අධ්‍යයනය
   ආයතනික ඖෂධවේදය සහ ජීවන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සඟරාව -2012 (පිටුව 74-88)
2. ජානු සන්ධි ආශ්‍රිත oestioarthritis සඳහා ජලෞකා ආවරණය සාන්ද්‍රණය හා එහි සාඵල්‍යතාව
   ආයතනික ඖෂධවේදය සහ ජීවන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සඟරාව -2012 (පිටුව 40-49)
3. Gentamicin මගින් ඇති කල වෘක්ක විෂ තත්වය සඳහා cucumis melo Linn ශාඛයේ මෙතනෝල් නිස්සාරකයේ වෘක්ක ආරක්ෂණ හැකියාව ඇගයීම
   ඖෂධ වර්ගීකරණය සහ පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර සඟරාව -2012 (පිටුව 40-53)
4. Althaea rosea Linn ශාඛයේ Pharmacognositical physicochemical & Phytochemical හැකියාව විමර්ෂණය
   ඖෂධ පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව -2012 (පිටුව 129-140)
5. Cucumis melo Linn ශාඛයේ Pharmacognositical අධ්‍යයන හා එහි ප්‍රමිතිකරණ පරාමිතීන් නිර්ණය කිරීම සඳහා අධ්‍යයනයක්
   ඖෂධ තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සඟරාව -2012 (පිටුව 36-46)
6. Strychinus Nux Vomica Linn ශාඛයේ තත්ව ප්‍රමිතීන් හා Phytochemical විශ්ලේෂණය
   විශ්වීය ඖෂධ සහ ජීවන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සඟරාව -2012 (පිටුව 36-46)
7. Free radical සහ හෘද රෝග ප්‍රගමනය සහ සංරක්ෂණය සඳහා යුනානි ඖෂධයන් පිළිබඳ විශේෂ අධ්‍යයනය
   හැම්ඩාඩ් විශ්වවිද්‍යාලයේ 2012 මාර්තු මස පැවති ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදී.
8. Nephroprotectine ක්‍රියාවලිය සඳහා ඖෂධීය ශාඛයන්හි විභවතාවය අධ්‍යයනය
   හැම්ඩාඩ් විශ්වවිද්‍යාලයේ 2012 මාර්තු මස පැවති ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදී.
9. මී පැණි Proplietic medicine හි ප්‍රතිකාරමය ගුණාංග
   හැම්ඩාඩ් විශ්වවිද්‍යාලයේ 2012 මාර්තු මස පැවති ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදී.
10. ඉස්ලාමික් වෛද්‍ය ක්‍රමයේ සඳහන් , Capping therapy (Ilaj,Bill,Hajama)
    හැම්ඩාඩ් විශ්වවිද්‍යාලයේ 2012 මාර්තු මස පැවති ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදී.
11. Life style disordes සඳහා ජලෞකා ප්‍රතිකාර ක්‍රමවේදය
    හැම්ඩාඩ් විශ්වවිද්‍යාලයේ 2012 මාර්තු මස පැවති ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදී.
12. අක්මා රෝග සඳහා Life Style අනුකූලතාවය සහ යුනානි ඖෂධීය ප්‍රතිකාර
    හැම්ඩාඩ් විශ්වවිද්‍යාලයේ 2012 මාර්තු මස පැවති ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදී.

## 3.9 දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශ්‍රී ලාංකේය වාර ප්‍රකාශනය (SLJIM)-2012

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස ඉදිරිපත් කරනු ලබන සඟරාව දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශ්‍රී ලංකා සඟරාව (Sri Lanka Journal of Indigenous Medicine) ලෙස හැඳින්වේ.

මෙම සඟරාවේ සංස්කාරක මණ්ඩලය වන්නේ

ප්‍රධාන සංස්කාරක - මහාචාර්ය ඒ.පී.ජී. අමරසිංහ

සහය සංස්කාරක - ආචාර්ය එච්.ඒ.එස්. ආරියවංශ
ආචාර්ය ඒ.එච්.එම්.මව්ජූඩ්
වෛද්‍ය ඩී.පී.ඒ.දිසානායක

සංස්කාරක මණ්ඩල සාමාජිකයින් - ආචාර්ය බී.එම්.නජීබ්
වෛද්‍ය එස්.ඩී.හපුආරච්චි
ආචාර්ය කේ.බී.ජයවර්ධන

**(වෙළුම 02 කලාපය 01 පිටු අංක 101-146 ජුනි 2012 ISSN 2012 -9238)**

| පර්යේෂණ/ප්‍රකාශන මාතෘකාව | පිටුව | ආචාර්යවරයාගේ නම |
|---|---|---|
| ඇකාසියා ඇරබිකා ශාඛය මගින් යෝනි භ්‍රංශ රෝගී කාන්තාවන්ගේ ජීවිත ගුණාත්මක බව ඉහළ නැංවීමේ හැකියාව | 101 | එම්.යූ.ඉසෙඩ්.එන්. ෆර්සානා<br>අයි. ෂාම්දීන්<br>ඒ. සුල්තානා |
| ළමුන්ගේ රතගාය රෝගය කෙරෙහි රත කල්කයේ සාඵල්‍යතාව | 107 | බී.ඩබ්. පද්මශාන්ති<br>ඒ.පී.ජී. අමරසිංහ |
| ශාඛ ඖෂධ සංයෝගවල ඇෆ්ලටොක්සින් ව්‍යාප ලෙස පෙන්නුම් කිරීම | 112 | තිස්ස හේවාවිතාරණ<br>එම්.එච්.ඒ. තිසේරා<br>කේ.ආර්. දයානන්ද<br>කේ.කේ.ඩී.එස්. රණවීර<br>පී.ඒ.ජේ. යාපා |
| ගර්භපාල් රස භාවිතයේදී කලල සහ මාතෘ රුධිරයේ ලෝහ හඳුනා ගැනීම, ජෛව රසායනික සහ රක්තවේදනාමක අධ්‍යයන | 120 | මිස්රා දීපා<br>සිංහමුක්තා<br>ස්වීවෙදි මන්ජරි<br>මිෂ්රා ප්‍රදීප්<br>කුමාර් විකාස් |
| ස්කොපොලැමින් මගින් උත්තේජිත මීයන් කෙරෙහි බ්‍රාහ්මී ඝෘතයේ ක්‍රියාකාරිත්වය ලඝු සූතශේකර රස පෙතිවල භෞත රසායනික ඇගයීම | 127 | කපිල් දියෝ යදව්<br>කේ.ආර්.සී. රෙඩ් |
| ලඝු සූතශේකර රස පෙතිවල භෞත රසායනික ඇගැයීම | 133 | ෂර්මා වින්ද්‍යා<br>ඩී.බී. වැගේලා<br>සී.ආර්.හරිෂා<br>වී.ජේ.ෂුක්ලා<br>පී.කේ.ප්‍රජාපතී |
| ජාම්නගර් ආයුර්වේද පශ්චාත් උපාධි සහ පර්යේෂණ ආයතනයේ තමක ශ්වාස රෝගය සම්බන්ධව සිදුකල සායනික අධ්‍යයන පිළිබඳ සංචිධිත සමීක්ෂණය | 144 | ආර්වින්ද් කුමාර් ඩුබේ<br>රාජ්ගෝපලා එස්.<br>කල්පනා එස්. පටෙල් |

**3.10 වැඩ සටහන් ,සම්මන්ත්‍රණ සහ වැඩ මුළු පිළිබඳ විස්තර**

| **විෂයය** | **පවතින** | **අවසන් කළ** | **ඉදිරිපත් කළ** |
|---|---|---|---|
| පශ්චාත් උපාධි සංඛ්‍යාව | 01 | | 01 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | 02 | | |
| උපාධි වැඩසටහන් සංඛ්‍යාව | 02 | | |
| ඩිප්ලෝමා වැඩ සටහන් සංඛ්‍යාව | 01 | | |
| සහතික පත්‍ර වැඩසටහන් සංඛ්‍යාව | | | |
| එකතුව | 06 | | 01 |

**3.11 ශිෂ්‍ය සුභසාධන**

ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්වයන් ලෙස සිසුන්ට මූල්‍යාධාර සපයනු ලැබේ.

**(1) මහපොළ ශිෂ්‍යත්ව**

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ දායකත්වය මත කුසලතා හෝ සාමාන්‍ය වශයෙන් ශිෂ්‍යයෙකුට මසකට රු.2550/- හෝ රු.2500/- මුදලක් පිරිනමනු ලැබේ.

| **වසර** | **මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව** |
|---|---|
| ප්‍රථම වසර | 41 |
| දෙවන වසර | 41 |
| තෙවන වසර | 44 |
| සිව්වන වසර | 43 |
| අවසන් වසර | 25 |
| එකතුව | 194 |

**(2) ශිෂ්‍යාධාර**

සම්පූර්ණ ශිෂ්‍යාධාර සහ අර්ධ ශිෂ්‍යාධාර ලෙස ශිෂ්‍යයෙකුට රු. 2000/- හෝ රු. 1900/- මුදලක් ගෙවනු ලැබේ.

| **වසර** | **ශිෂ්‍යාධාර** |
|---|---|
| ප්‍රථම වසර | 89 |
| දෙවන වසර | 64 |
| තෙවන වසර | 65 |
| සිව්වන වසර | 47 |
| අවසන් වසර | 44 |
| එකතුව | 309 |

### (3) ශිෂ්‍ය නේවාසිකාගාර

ආයතනයේ සිසුන්ගේ නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා ප්‍රධාන නේවාසිකාගාර දෙකක් සහ නේවාසික නිවාසයක් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ශිෂ්‍යයන් සඳහා අංක 344 ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මාවතේ ඇති පිරිමි ශිෂ්‍ය නේවාසිකාගාරයද ශිෂ්‍යාවන් සඳහා මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාරය සහ රාජගිරියේ අංක 12 දරණ නේවාසික නිවාසයද පවත්වාගෙන යනු ලැබේ.

| නේවාසිකාගාරයේ නම | නේවාසික සිසුන් සංඛ්‍යාව |
|---|---|
| පිරිමි ශිෂ්‍ය නේවාසිකාගාරය | 110 |
| මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාරය | 280 |
| රාජගිරිය කාන්තා නේවාසික නිවාසය | 40 |
| එකතුව | 430 |

### (4) ආයතනයේ ශිෂ්‍ය සංගම්

මෙම ආයතනයේ ශිෂ්‍ය සංගමය දේශීය වෛද්‍ය ශිෂ්‍ය කමිටුව ලෙස ක්‍රියාත්මක වේ. එය සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු නිලධාරි මණ්ඩලයකින් සමන්විත වේ. ඔවුන් වසරකට වරක් පත් කෙරේ. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු එහි ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස කටයුතු කරයි. මෙම ශිෂ්‍ය කමිටුව ප්‍රධාන අනු කමිටු තුනක් (03) යටතේ ක්‍රියාත්මක වේ.

**i. කලා අනුකමිටුව**

කලා හා සංස්කෘතික කටයුතු, කලා උළෙල සංවිධානය කිරීම සහ සිසුන්ගේ කලා කටයුතු වර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මේ යටතේ සිදු වේ.

**ii. ආයුර්වේද ව්‍යාප්ති අනුකමිටුව**

මේ යටතේ පාසල් වල ආයුර්වේදය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම, ජංගම සායන සහ ප්‍රජා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම, කුකුස නමින් සංවාද වැඩසටහනක් පැවැත්වීම සිදු වේ.

**iii. ක්‍රීඩා අනුකමිටුව**

වාර්ෂික ක්‍රීඩා උත්සවය සහ අවුරුදු උත්සවය සංවිධානය කිරීම, නවක සිසුන්ගේ ක්‍රීඩා උළෙල පැවැත්වීම, විවිධ ක්‍රීඩාවන් සඳහා සිසුන් යොමු කිරීම හා කාය වර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම එමගින් සිදු වේ.

### 3.12 ආයුර්වේද ශික්ෂණ රෝහල

ආයුර්වේද ශික්ෂණ රෝහල දේශීය වෛද්‍ය අමාත්‍යංශය යටතේ පාලනය වන අතර එය උපාධි අපේක්ෂකයන්ට සායනික පුහුණුව ලබා දීමේ සහ රෝගී ප්‍රතිකාර සේවය සඳහා වෙන් වී ඇත.රෝහල් අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙය ආයතනයට මීටර් 100ක් පමණ දුරින් කෝට්ටේ පාරේ පිහිටා ඇත.

මෙම රෝහල රෝගීන් සඳහා ඇඳන් 395 ක් සහිත වූ නේවාසික රෝගී අංශය,බාහිර රෝගී අංශය, ඖෂධ නිෂ්පාදන අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනකින් යුක්තය. රෝගීන් සඳහා පැවැත්වෙන විශේෂ සායන ලෙස ශල්‍ය ශාලාක්‍ය, ස්ත්‍රී රෝග,කෞමාරභෘත්‍ය,පංචකර්ම සහ සර්වාංග රෝග සඳහා මෙන්ම විශේෂ පාරම්පරික වෛද්‍ය සායන (සර්ප විෂ,කැඩුම් බිඳුම්, ගෙඩිවණ,පිළිකා, දැවුම් පිළිස්සුම්) පැවැත්වෙන අතර දිනපතා රෝගීන් 500 ට පමණ ප්‍රතිකාර ලබා දේ. විශේෂ උපදේශන සේවාවන් වශයෙන් මනෝ උපදේශනය, යෝග අභ්‍යාස සහ චිකිත්සා සේවා පවත්වයි. සීමාවාසික පුහුණුව ලබන වෛද්‍යවරුන් සහ හෙද නිලධාරීන් පුහුණු කිරීමද රෝහලේ ප්‍රධාන පුහුණු කටයුතු අතර වේ.

මෙම සායනික කටයුතු සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර්ය මණ්ඩලයද සහභාගි වන අතර ඒ අනුව සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමට මෙන්ම ආයුර්වේද ශික්ෂණ රෝහලට පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමටද ඔවුන්ගේ දායකත්වය නොමදව ලැබේ.

### 3.13 යටිතල පහසුකම් සංවර්ධනය

2012 වසරේදී ආයතනයේ පහත සඳහන් යටිතල පහසුකම් සංවර්ධනය සිදු කර ඇත.

| | **විස්තරය** | **වියදම රු. (බදු රහිතව)** | **වර්තමාන තත්වය** |
|---|---|---|---|
| 1. | මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු<br>A ගොඩනැගිල්ල -<br>B ගොඩනැගිල්ල -<br>උපපාලිකා නිවාසය - | <br><br>1,481,123.84<br>1,388,723.96<br>1,160,029.70 | වැඩ අවසන් කර ඇත. |
| 2. | පුස්තකාල ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු | 2,631,275.00 | වැඩ අවසන් කර ඇත. |
| 3. | පැරණි ගොඩනැගිලි සංකීර්ණයේ පිහිටි අධ්‍යක්ෂ කාමර සහ කථිකාචාර්ය කාමර අළුත්වැඩියා කිරීම | 3,143,900.00 | වැඩ අවසන් කර ඇත. |
| 4. | නව ගොඩනැගිල්ලේ පරිපාලන සහ අධ්‍යයන අංශවල අළුත්වැඩියා කටයුතු | 2,475,400.00 | වැඩ අවසන් කර ඇත. |
| 5. | විභාග අංශයේ,ආයුර්වේද දේශණශාලා 01,02 කියවීම් ශාලාව අළුත්වැඩියා කිරීම | 2,697,530.00 | වැඩ අවසන් කර ඇත. |
| 6. | යුනානි දේශණශාලා 03 අළුත්වැඩියා කිරීම | 562,500.00 | වැඩ අවසන් කර ඇත. |
| 7. | ප්‍රධාන පුස්තකාලයේ විදුලි රැහැන්, විදුලි පරිපථ අළුත්වැඩියාව නව විදුලිබල්බ පද්ධතියක් සවි කිරීම | 999,000.00 | වැඩ අවසන් කර ඇත. |
| 8. | පුස්තකාලයේ ගෘහභාණ්ඩ අළුත්වැඩියා කිරීම සහ පොලිෂ් කිරීම | 2,361,000.00 | වැඩ අවසන් කර ඇත. |
| 9. | ශල්‍ය ශාලාක්‍ය අංශයේ සහ පැළෑටි සංවර්ධන විද්‍යාගාරයේ අළුත්වැඩියා කටයුතු | 4189210.00 | ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. |
| 10. | ලොකර් කාමරයේ ඉදිකිරීම් කටයුතු | 1,709,845.00 | ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. |
| 11. | අන්තර්ජාල පහසුකම් ලබා දීම | මාසික කුලිය රු.90,000 වේ | සපයා ඇත. |
| 12. | ආයතනයේ නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිරිපිට භූමිය අලංකාර කිරීම | 168,000.00 | 70 %ක් වැඩ අවසන් කර ඇත. |
| | මුළු මුදල (එකතුව) | රු.20,667,537.50 | |

කාලයක් තිස්සේ පැවති අවශ්‍යතාවයක් ඉටු කරමින් 2012 වර්ෂයේදී ඉහත අළුත්වැඩියාවක් මගින් ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය සිදු වී ඇත.

**4. ජාත්‍යන්තර සබඳතා**

**1. නේපාලයේ කත්මණ්ඩු විශ්වවිද්‍යාලය සමග අත්සන් කල අවබෝධතා ගිවිසුම**

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය සහ නේපාලයේ කත්මණ්ඩු විශ්වවිද්‍යාලය අතර අත්සන් කල අවබෝධතා ගිවිසුම යටතේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ MD (ආයුර්වේද) පාඨමාලාව සඳහා නේපාල සිසුන් සහභාගි කර වීම සහ නේපාලයේ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ හැදෑරීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර්යවරුන්ට සහ පශ්චාත් උපාධි සිසුන්ට අවස්ථාව ලබා දීම එමගින් සිදු වේ.

**2. ඉන්දියාවේ හැම්ඩාර්ඩ් විශ්ව විද්‍යාලය සමග අත්සන් කළ අවබෝධතා ගිවිසුම**

යුනානි වෛද්‍ය පාඨමාලා වැඩි දියුණු කිරීමට සහාය ලබාගැනීමට යුනානි වෛද්‍ය අංශය ඉන්දියාවේ හැම්ඩාර්ඩ් විශ්ව විද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

**5. මූල්‍ය සහ ගිණුම් පිළිබඳ විස්තර**

**I. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර**

| **විෂයය** | **2011 රු.** | **2012 රු.** |
|---|---|---|
| අ. පුද්ගල පාරිශ්‍රමික | 109,451,141 | 131,712,424 |
| ආ.ගමන් වියදම් | 1,371,217 | 1,722,680 |
| ඇ.සැපයුම් | 5,007,242 | 6,081,310 |
| ඈ.නඩත්තු | 1,598,880 | 1,477,703 |
| ඉ.කොන්ත්‍රාත් සේවා | 14,523,565 | 19,772,382 |
| ඊ.වෙනත් | 2,528,446 | 2,910,196 |
| එකතුව | 134,480,492 | 163,676,695 |

**II. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර**

| **විෂයය** | **2011** | **2012** |
|---|---|---|
| අ. ලී බඩු සහ කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම් | 5,766,298 | 2,242,972 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම් | 350,000 | 3,999,360 |
| ඇ. ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කර ගැනීම් | 15,342,867 | 13,251,299 |
| ඈ.වෙනත් | | 467,612 |
| එකතුව | 21,459,165 | 19,961,243 |

සටහන:

IRQUE ව්‍යාපෘතිය මගින් ප්‍රදානය කරන ලද රු.10,820,386 වටිනා උපකරණ සහ රු.525,722 වටිනා පොත් ප්‍රදානයන් 2011 වර්ෂික ගිණුම්වල ඇතුලත් කර ඇත.

### III. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්)

| විෂයය | 2012 ප්‍රතිපාදන රු. | 2012 වියදම් රු. | ඉතුරුම්/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 158,200,000 | 163,676,695 | -(5,476,695) |
| ආ.ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 36,400,000 | 19,961,243 | 16,438,757 |
| ඇ.ව්‍යාපෘතිය-දේශීය අරමුදල් සැපයූ | - | - | - |
| ඈ.ව්‍යාපෘතිය - විදේශීය අරමුදල් සැපයූ | - | - | - |

### IV. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම)

| ආදායම් ප්‍රකාශය | 2012 ප්‍රතිපාදන රු. | 2012 වර්ෂයේ එකතුව රු. | හිඟය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක අධ්‍යයන | - | - | - |
| ආ. පශ්වාත් උපාධි අධ්‍යයන | 48,000 | 48,000 | (658,334) |
| ඉ. උපදේශක සේවා | | | |
| ඊ. වෙනත් ආයුර්වේද ඖෂධ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2,083,334<br>805,000 | 1,425,000<br>525,000 | (658,334)<br>(280,000) |

### V. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය -2011

| විෂයය | සංකේතය | එක් ශිෂ්‍යයකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ.ශිෂ්‍යයකුගේ පුනරාවර්තන වියදම (RE) | 206,959,684/698 | 296,503 |
| ආ.ශිෂ්‍යයකුගේ ප්‍රාග්ධන වියදම (CE) | 19,731,668/698 | 28,268 |

### ★ කලින් තිබූ අඩුපාඩු නිවැරදි කිරීම

මින් පෙර රජයේ විගණන අංශය මගින් පෙන්වා දී තිබූ බොහෝ අඩුපාඩු නිවැරදි කර ගැනීමට 2012 වර්ෂයේදී විශේෂ පරිශ්‍රමයක් දරණ ලද බවද මෙහි ලා සඳහන් කල යුතුය.

විශේෂයෙන්

- විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම ප්‍රමාද වීම
- අධ්‍යයන අංශවලින් ඉවත්ව යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයක් වීම
- අධ්‍යයන අංශවලින් නිකුත්වන අවසන් විභාග ප්‍රතිඵල අනුව අසමත් වීමේ ප්‍රතිශතය වැඩි වීම
- මෙම ආයතනයෙන් බිහිවන උපාධිධරයන් සඳහා රැකියා ලැබීමේ සුරක්ෂිතතාව මදි වීම
- පශ්වාත් උපාධි පාඨමාලා අඩු වීම

යන සියළු ප්‍රශ්නවලට 2012 වර්ෂයේදී පිළිතුරු ලබා දී ඇත.

1. 2012 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සියල්ලටම පිළිතුරු සපයා ඇත.

2. මෙම ආයතනයේ පාඨමාලා සඳහා තේරී එන සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් අතර මගදී වෙනත් පාඨමාලා සඳහා මෙම ආයතනය හැර යාම 2012 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නවත්වන ලදී.

| 0 | අළුත්වැඩියා අත්තිකාරම් | 0 |
| -1,482 | මාරුකිරීම් | 0 |
| -1,550 | ගෙවිය යුතු ගමන් ගාස්තු | 0 |
| -14,098 | රක්ෂණ අග්‍රිමය | 0 |
| -10,441 | රක්ෂණ අත්තිකාරම් | 0 |
| 174,100 | DAFP ගිණුම | -51,930 |
| 86,000 | ලංසු බැඳුම්කර | -41,500 |
| 290 | නොගෙවූ සහතික ආදායම | 290 |
| 1,994,066 | ආයුර්වේද ප්‍රදර්ශනය | -1,758,062 |
| | රඳවාගැනීම් | 200 |
| 2,264,118 | රඳවාගැනීම්-ප්‍රාග්ධනය | 1,113,334 |
| 488 | අධි තැන්පතු | 0 |
| 2,250 | විශේෂ අත්තිකාරම් | -2,250 |
| 901 | පොත් අත්තිකාරම් | 0 |
| 210,000 | භායිසජ්ජා වෙතින් පූර්ව-ලැබීම් | -210,000 |
| 80,000 | ගෙවිය යුතු ගිණුම - පශ්චාත් උපාධි | 0 |
| 861,991 | පශ්චාත් උපාධි වෙතින් පූර්ව-ලැබීම් | -861,991 |
| | UGC වෙත ගෙවිය යුතු දෑ | 77,550 |
| | උපචිත වියදම් - M.D | 648,508.00 |
| 1,768,831 | | -609,275 |

| | | |
|---|---|---|
| | උපචිත වියදම්වල අඩුවීම | |
| | උපචිත වියදම් | 2,355,695 |
| | උපචිත වියදම් - ප්‍රාග්ධන | 3,268,486 |
| | | **5,624,181.00** |

## දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

### අයවැයගත ප්‍රතිපාදන සහ සත්‍ය වියදම - 2012

| 2011<br>1 | කේත අංකය<br>2 | 3 | අනුමත අයවැය 2012<br>4 | සත්‍ය 2012<br>5 | අතිරික්තය හෝ හිඟය (4-5)<br>6 | හේතු<br>7 |
|---|---|---|---|---|---|---|
| 109,451,141 | 1 | පුද්ගල වේතන | 126,970,000 | 130,965,674 | -3,995,674 | වැටුප් වැඩි කිරීම හේතුවෙන් |
| 1,371,217 | 2 | ගමන් වියදම් | 1,430,000 | 1,722,681 | -292,681 | විදේශ සංචාර හේතුවෙන් |
| 4,997,243 | 3 | සැපයුම් සහ පාරිභෝජන | 4,100,000 | 5,857,710 | -1,757,710 | අයිතමවල වෙළඳපොළ අගය වැඩිවීම හේතුවෙන් |
| 1,598,880 | 4 | නඩත්තු | 2,200,000 | 1,455,603 | 744,397 | අඩු නඩත්තු කටයුතු හේතුවෙන් |
| 14,458,765 | 5 | ගිවිසුම්ගත සේවා | 21,100,000 | 20,557,911 | 542,089 | ආරක්ෂණ සහ පිරිසිදු කිරීම් සේවා බිල් නොගෙවීම හේතුවෙන් |
| 4,510,000 | 6 | වෙනත් පුනරාවර්තන වියදම් | 9,900,000 | 2,777,342 | 7,122,658 | වෙනත් පුනරාවර්තන වියදම් පාලනය |
| 136,387,246 | | මුලු පුනරාවර්තන වියදම | 165,700,000 | 163,336 ,921 | 2,363,079 | |
| | | | | | | |

නියෝජ්‍ය මුල්‍යාධිකාරි

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

**2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට සටහන්**

**1.** වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1.1** සාමාන්‍ය ප්‍රතිපත්ති

**1.1.1** වාර්තාකරණ පුද්ගලභාවය

කොළඹ විශ්වවිද්‍යාලයීය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය **1978** අංක **16** දරණ විශ්වවිද්‍යාල පනත සහ අංක **67/14** දරණ ආඥා පනත යටතේ **1980.01.01** වන දින සංස්ථාපිත කරන ලදී

ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශවලින් වත්කම්, වගකීම්, ශුද්ධ වත්කම්, ආදායම්, වියදම් සහ ආයතනයේ සියලු මෙහෙයුම්වල වෙනත් ගනුදෙනු නිරූපණය කරයි

මෙම මූල්‍ය ප්‍රකාශ **1985** අංක **7** දරණ විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත ඇතුළුව පසු ව්‍යවස්ථාවන් මගින් සංශෝධනය කළ පරිදි විශ්වවිද්‍යාල පනතේ වගන්ති **106(1), (2)** සහ **107(b)** සහ **1971** අංක **38** දරණ මුදල් පනතට අනුකූලව මූල්‍ය පරිපාලනය විසින් පිළියෙල කර ඇත.

**1.1.2** ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

**IIM** යනු ආයුර්වේදය, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ උපදෙස් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම් වලදී සපයන ශ්‍රී ලංකාවේ ප්‍රධාන උසස් අධ්‍යාපන ආයතනයකි. ආයුර්වේද විද්‍යාලය ප්‍රථම වරට දිවයිනේ ආරම්භ කර පසුව උසස් කර **1977** වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය ලෙස කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී.

**IIM** මූලික සෞඛ්‍ය සේවා පහසුකම්, සාමාන්‍ය සෞඛ්‍ය සේවා

ආයතනය ප්‍රධානවම රජයේ ප්‍රදාන මත මෙහෙය වේ.

**1.1.3** පිළියෙළ කිරීමේ පදනම

**(i)** අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන්වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. මෙම ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට **(SLAS)** අනුකූලව පිළියෙළ කර ඇත.

**(ii)** ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇති අතර දක්වා ඇති අවස්ථාවල දී හැර මුදලේ වෙනස සැලකිල්ලට ගෙන නැත. පිරිවැය වත්කම් හුවමාරුවේ දී දෙන ලද ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත පදනම් වේ.

**(iii)** ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල

මූල්‍ය ප්‍රකාශ ආයතනයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල වන ශ්‍රී ලංකා මුදලින් ඉදිරිපත් කර ඇත.

**1.2** වත්කම් සහ ඒවායේ වටිනාකම් වල පදනම

**1.2.1** දේපළ, පිරියත සහ උපකරණ

**2011.01.01** දින සිට බලපැවැත්වෙන පරිදි ආයතනයේ කාර්යාලය, විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ, ගොඩනැගිලි, ගෘහභාණ්ඩ සහ සවිකිරීම් සහ වාහන ප්‍රත්‍යාගණනය කර හඳුනාගෙන ඇත. ඉඩම්වල ප්‍රත්‍යාගණිත අගය **2011.12.31** වන දිනට මූල්‍ය ප්‍රකාශ තුළ සැලකිල්ලට ගෙන ඇත. කාලපරිච්ඡේදය තුළ මිලදී ගත් දේපස, පිරියත සහ උපකරණ සහ පුස්තකාල පොත් පිරිවැය අගයට පෙන්වා ඇත.

ක්ෂය ප්‍රත්‍යාගණිත වටිනාකම් මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයට අයකර ඇති අතර මිලදී ගැනුම් පිරිවැය මත වර්ෂය සඳහා පහත අනුපාත යොදා ගැනිණි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| කාර්යාල විද්‍යාගාරය සහ ඉගැන්වීමේ උපකරණ | 20% |
| පරිගණක | 20% |
| මෝටර් වාහන | 20% |
| පුස්තකාල පොත් | 20% |

රුපි. මිලියන 28.8 ක් 2012 වර්ෂයේ ක්ෂය වෙනුවෙන් වෙන්කර ඇත. එය රුපි. මිලියන 1.9 කින් වැඩිවී ඇත.

තොග වටිනාකම 2011 වර්ෂයට වඩා අඩුවී ඇති බව දක්නට ලැබිණි. එනම් රුපි. මිලියන 0.8

ලැබිය යුතු මුදල් රුපි. මිලියන 4.9 කින් ණය සහ අත්තිකාරම් අඩුවීම හේතුකොට ගෙන අඩුවී ඇත

**1.2.2** තොග

තොග පිරිවැයට අගය කොට ඇත.

**1.2.3** ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවායේ උපලබ්ධි අපේක්ෂිත වටිනාකම් වලට පිහිටුවා ඇත.

**1.2.4** කෙටිකාලීන ආයෝජන

සමහර ආයෝජන එහි පොලී සහිතව නැවත අළුත් කර ඇත.

## 1.3 වගකීම් සහ වෙන්කිරීම්

**2012.12.31** දිනට දන්නා සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වන අතර පවතින බව දන්නා නමුත් වටිනාකම් නිවැරදිව තක්සේරු කළ නොහැකි වගකීම් වෙනුවෙන් ප්‍රමාණවත් වෙන්කිරීම් කර ඇත.

ඉල්ලූ විට හෝ වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු බැඳියාවන් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය තුළ ජංගම වගකීම් ලෙස සලකා ඇත. එක් වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය තුළ ජංගම නොවන වගකීම් ලෙස සලකා ඇත.

### 1.3.1 ප්‍රදාන වෙනුවෙන් ගිණුම්කරණය

හටගත් වියදම් වෙනුවෙන් ආයතනයට හානිපූරණය කරන ප්‍රදාන වියදම් හඳුනාගත් වර්ෂය තුළදී ම මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය තුළ හඳුනාගෙන ඇත. වත්කමක පිරිවැය වෙනුවෙන් ආයතනයට හානිපූරණය කරන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමවත් පදනමක් මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

### 1.3.2 සේවක ප්‍රතිලාභ

ආයතනය සියලු සුදුසුකම් සපුරන සේවකයන් වෙනුවෙන් **1983** අංක **12** දරණ පාරිතෝෂික ගෙවීම් පිළිබඳ පනත පරිදි ප්‍රතිලාභ සැලසුම යොදා ගෙන ඇත.

සේවකයකු විශ්‍රාම ගැනීමේ දී ලබා ගනු ඇති ප්‍රතිලාභ ප්‍රමාණය සැලසුම් කරන නිර්වචනය කළ ප්‍රතිලාභ, සාමාන්‍යයෙන් වයස, සේවය කළ වර්ෂ ගණන සහ හානිපූරණය යනාදි කරුණු මත රඳා පවතී.

නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්වය තුළ හඳුනාගත් වගකීම් **2013.12.31** දිනට වර්තමාන අගයයි.

## 1.4 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභය ආයතනය වෙතට ගලා එනු ඇත යන සම්භාවිතාවය තෙක් ආදායම් හඳුනාගෙන ඇත.

**2012** වර්ෂය සඳහා පුනරාවර්තන, ශිෂ්‍යාධාර සහ මහපොළ අභ්‍යන්තර ආදායම වෙනුවෙන් කළ රජයේ මුළු ප්‍රදාන රුපි. මිලියන **170.4** ක් විය.

## 1.5 වියදම

හටගත් පිරිවැය සහ නිශ්චිත අයිතම් ආදායම අතර සෘජු සම්බන්ධතාවය මත පදනම්ව මූල්‍ය කාර්යසාධනය තුළ වියදම් හඳුනා ගනී. ආයතනය නඩත්තු කිරීමේ දී සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී හටගත් සියලු වියදම් වර්ෂය සඳහා අතිරික්තය/හිඟය වෙත ළඟා වීමේ දී ආදායමට අයකර ඇත.

## 1.6 සංසන්දනාත්මක තොරතුරු

හැකි සෑම විටම සංසන්දනාත්මක අගයන් සෑම ප්‍රකාශයක් තුළම පෙන්වා ඇත.

**නියෝජ්‍ය මූල්‍යාධිකාරී/IIM**

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ඊසී/ජී/අයිඅයිඑම්/එෆ්ජ්/12 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2013 ඔක්තෝබර් 15 දින |

අධ්‍යක්ෂ

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2013 ජූලි 05 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ. මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වූ නියැදි පරීක්ෂණයේදි අනාවරණය වූ එකතුව රු.31,432,441 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2013 ජුලි 19 දිනැති කෙටුම්පත් වාර්තාව මගින් යොමු කරන ලද අතර එම ගිණුම්කරණ අඩුපාඩුවලින් රු.25,991,908 ක් වූ ජේද 31ක් නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 අගෝස්තු 15 දින විගණනයට ඉදිරිපත් කෙරුණි.

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 01 දිනට පොදු සංචිත ගිණුමේ ආරම්භක ශේෂය රු.41,240 ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) 2010 හා 2011 වර්ෂයන්හි පවත්වන ලද පාඨමාලා දෙකක ආදායම, එම වර්ෂයන්හි ආදායම් හා වියදම් ගිණුම්වලට මාරු නොකිරීම නිසා එම පාඨමාලා ලෙජර් ගිණුම්වල ඉතිරි වූ රු.1,112,630 ක් වූ බැර ශේෂය තවදුරටත් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලාව සඳහා ආයතනයේ පොදු අරමුදලෙන් දරන ලද රු.41,308 ක් වූ පොදුකාර්ය වියදම පශ්චාත් උපාධි ගිණුමෙන් අය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා එම වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනයේ ආයතනයේ වියදම් හා පශ්චාත් උපාධි ගිණුමේ බැර ශේෂය වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ඈ) පශ්චාත් උපාධි පාඨමාලාවෙන් වෛද්‍ය විශාරද පාඨමාලාව වෙත මාරු වූ ශිෂ්‍යයෙකු වෙනුවෙන් රජයේ ආයතනයකින් ගෙවූ රු.80,000 ක් ආපසු ගෙවීමට හෝ වෛද්‍ය විශාරද පාඨමාලාවට මාරු කිරීමට හෝ කටයුතු නොකර ජංගම වගකීම් යටතේ තබා ගෙන තිබුණි.

(ඉ) 2011 වර්ෂයේ රු.318,070,239 කට ප්‍රත්‍යාගණනය කරන ලද ස්ථාවර වත්කම්වල ඵලදායි ජීවිත කාලය ගණනය නොකර සම්පූර්ණ ජීවිත කාලය සහිත වත්කම් ලෙස සලකා ක්ෂය ගණනය කිරීම සහ ප්‍රත්‍යාගණිත වටිනාකම රු.373,850 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ ඒකක 50 ක් හා ගණනය නොකළ තවත් එම ඒකක 42 ක් ගිණුම්ගත නොකිරීම යන වැරදි සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.717,275 ක් පුනරාවර්තන වියදම් සඳහා වැයකර එම වටිනාකම රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් ආදායම් හා වියදම් ගිණුමට බැර කර තිබුණි.

(උ) පෙර වර්ෂයන්හි විගණන වාර්තා මගින් පෙන්වා දුන් සේවක ණය උපලේඛන හා ගිණුම් අතර පැවති වෙනස්කම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කරනු වෙනුවට පරිගණක ණය, සේවක ණය හා උත්සව අත්තිකාරම් ගිණුම්වල පැවති එකතුව රු.100,477 ක් වූ අයවිය යුතු ශේෂයන් පොදු සංචිත ගිණුමට කපා හැර තිබුණි.

(ඌ) බාහිර පාර්ශවයකින් ලැබිය යුතු රු.91,267 ක ශේෂයක්, ගෙවිය යුතු ආරක්ෂක තැන්පතුවලට හිලව්කර දක්වා තිබුණි.

2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

අවලංගු කළ චෙක්පත් ලේඛනය අනුව 2008 - 2010 අතර කාලය තුළ අවලංගු කළ නමුත් නැවත නිකුත් නොකළ රු.1,508,152 ක් වටිනා චෙක්පත් 48 ක් පැවතිය ද 2011 ජනවාරි 01 දිනට ලෙජර් ගිණුමේ ශේෂය රු.31,797 ක් පමණක් වූ අතර එම ශේෂය හඳුනාගෙන ද නොතිබුණි.

2.2.3 ලැබිය යුතු ගිණුම්

සේවය හැරගිය හා මියගිය සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.626,489 ක් වූ ණය ශේෂ වසර 3 ක් සහ වසර 1 ½ ක කාලයක් හිඟ හිටව පැවැති අතර හිඟ හිටි දින පටන් ඒ සඳහා පොළී ගණනය කර නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) පුස්තකාල තැන්පතු | 59,460 | විස්තරාත්මක උපලේඛනය |
| (ආ) නේවාසිකාගාර තැන්පතු 2011 ජනවාරි 01 දිනට ශේෂය | 180,767 | -එම- |
| (ඇ) නොගෙවූ වැටුප් | 136,120 | -එම- |
| (ඈ) නොගෙවූ විභාග ගාස්තු 2011 ජනවාරි 01 දිනට ශේෂය | 62,772 | -එම- |
| (ඉ) ලංසු ඇප . | 44,500 | -එම- |
| (ඊ) තෙවන ආයුර්වේද ප්‍රදර්ශනය | 236,004 | -එම- |
| (උ) භෛසජ්ජ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2013 විලම්භිත ආදායම් | 519,621 | පාඨමාලා ලේඛනය හා උපලේඛනය |
| (ඌ) භෛසජ්ජ ඩිප්ලෝමා පාඨමාලාව - ලැබිය යුතු පාඨමාලා ගාස්තු | 280,000 | -එම- |
| (එ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදලින් නොවන අනෙකුත් ගැළපීම් | 5,602,966 | උපලේඛනය |

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කෙරේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 135 | මූල්‍ය පාලන බලතල පැවරීම් සීමාවන් ඉක්මවා රු.41,851,658 ක් වූ ගෙවීම් වවුචර් 14 ක් අනුමත කර තිබුණු අතර රු.16,208,525 ක් වටිනා ගෙවීම් වවුචර් 16 ක් සහතික කර තිබුණි. |
| (ii) මු.රෙ. 264 | ගෙවීම් වවුචර් 08 කින් සිදු කළ රු.954,768 ක් වූ ගෙවීම් සඳහා කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය සහ 20 පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම ලේඛණයක සටහන් නොකර සහ ඔවුන් ලබාගත් නිවාඩු සනාථ කර නොගෙන රු.87,065,980 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.169,967,984 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.165,903,410 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබූ රු.157,697,275 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොටගෙන එම ඌනතාවය රු.12,270,709 ක් දක්වා අඩුවී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.140,055,816 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොටගෙන එම ඌනතාවය රු.25,847,594 ක් දක්වා අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.13,576,885 ක වර්ධනය සඳහා රජයේ ප්‍රදානය පෙර වර්ෂයට වඩා රු.17,641,459 කින් වැඩි වීම විශේෂයෙන් බලපා තිබුණි.

වසර ගණනාවක් තිස්සේ ආදායම් හා වියදම් ගිණුමෙන් ජනිත වන ඌනතාවය හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ආයතනයේ පොදු සංචිතය රු.127,114,484 ක හර ශේෂයක් වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). බාහිර පාර්ශවයක් විසින් ආයතනයේ නිලධාරීන්ට එරෙහිව පවරා තිබූ නඩු දෙකක් නිෂ්ප්‍රභා වුවද, නඩු ගාස්තුවලට යටත්ව නඩුව නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලීම් නොකිරීම හේතුවෙන් ඒ සඳහා පෞද්ගලික නීතිඥයන් වෙත ගෙවූ රු.420,693 ක් ආයතනයට දැරීමට සිදුවී තිබුණු අතර එම බාහිර පාර්ශවය විසින් ආයතනයට විරුද්ධව නැවත නඩු දෙකක් පවරා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුළ ආයතනයට එරෙහිව විභාගවෙමින් පැවති නඩු 05 ක් වෙනුවෙන් පැවති අසම්භාව්‍ය බැරකම පිළිබඳව ද මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යාපන කටයුතුවල යෙදුණු 632 ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා වැය කළ පුනරාවර්තන වියදම රු.198,136,912 ක් වූයෙන් ඒක ශිෂ්‍ය පිරිවැය රු.313,508 ක් විය. පෙර වර්ෂයේ අධ්‍යයන කටයුතුවල යෙදුණු 647 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වෙනුවෙන් වැය කළ පුනරාවර්තන වියදම රු.192,378,397 ක් වූයෙන් එම වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.297,339 ක් වී තිබුණි.

(ආ) ආයතනයේ ලියාපදිංචි 638 ක් වූ ශිෂ්‍යයන්ගෙන් පස්වන වසර වන විට රැඳී සිටි සංඛ්‍යාව 483 ක් වූ අතර එයින් 310 ක් පමණක් විභාග සමත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රවේශ වර්ෂය | ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 5 වන වසර රැඳීසිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 5 වන වසර සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 2006/2007 | 130 | 91 | 49 |
| 2005/2006 | 126 | 96 | 62 |
| 2004/2005 | 107 | 81 | 41 |
| 2003/2004 | 180 | 129 | 95 |
| 2002/2003 | 95 | 86 | 63 |
| | 638 | 483 | 310 |

(ඈ) 2012 වර්ෂයේ ශිෂ්‍ය ප්‍රගතිය

පසුගිය වසර 05 ක් තුළ බඳවාගනු ලැබූ 789 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 2012 වසර වන විට සිසුන් 632 ක් අධ්‍යයන කටයුතු හදාරමින් සිටි අතර සිසුන් 157 ක් පාඨමාලා හැර ගොස් තිබුණි. විස්තර පහත දැක්වේ.

| වසර | ප්‍රවේශ වර්ෂය | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | | | වර්තමානයේ සිටින සිසුන් සංඛ්‍යාව | | | පාඨමාලා හැර ගිය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | ආයුර්වේද | යුනානි | මුළු | ආයුර්වේද | යුනානි | මුළු | |
| 1 | 2010/2011 | 163 | 31 | 194 | 147 | 27 | 174 | 20 |
| 2 | 2009/2010 | 135 | 44 | 179 | 110 | 33 | 143 | 36 |
| 3 | 2008/2009 | 118 | 41 | 159 | 92 | 28 | 120 | 39 |
| 4 | 2007/2008 | 98 | 29 | 127 | 80 | 24 | 104 | 23 |
| 5 | 2006/2007 | 105 | 25 | 130 | 73 | 18 | 91 | 39 |
| | | 619 | 170 | 789 | 502 | 130 | 632 | 157 |

(ඇ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධි අංශයේ 53 ක් වූ මුළු අනුමත කථිකාචාර්යවරුන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව 8 දෙනෙක් පමණක් වුවද, සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරුන් 20 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

විෂයයන් 12 ක අභ්‍යන්තර දේශකවරුන් විසින් දේශන පැය 391 ක් ආවරණය කරන විට බාහිර දේශකවරුන් විසින් ඒ සඳහා පැය 404 ක් ද තවත් විෂයයන් 04 ක 188 ක් වූ මුළු දේශන පැය ප්‍රමාණයම ද ආවරණය කර තිබූ අතර අභ්‍යන්තර කථිකාචාර්යවරුන්ගේ සේවය උපරිම හා කාර්යක්ෂම අයුරින් ලබා නොගැනීම, සමහර විෂයන් සඳහා අභ්‍යන්තර දේශකවරුන් යොදවා නොගැනීම ඊට හේතු වී තිබුණි.

අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව 45 දෙනෙකු වූ තත්‍ය කථිකාචාර්යවරුන්ගෙන් 13 දෙනෙකුටම සප්ත වාර්ෂික හා අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි.

(ii) ආයුර්වේද විෂයයන් 04 ක් හැරුණු විට ඉතිරි විෂයයන් 27 ක් සඳහා එක් විෂයයකට කථිකාචාර්යවරුන් 02 ත් 08 ත් අතර ප්‍රමාණයක් අනුයුක්තව සිටි අතර ආවරණය කළ මුළු දේශන පැය ගණන 1276 ක් විය. ඒ අනුව එම එක් දේශකවරයෙකුගේ වාර්ෂික සාමාන්‍ය දේශන පැය ගණන 32 ක් පමණක් වී තිබුණි.

(iii) ආයුර්වේද වෛද්‍ය පාඨමාලාවේ විෂයයන් 07 ක් සඳහා පාඨමාලා ව්‍යවස්ථාව අනුව ආවරණය කළයුතු දේශන පැය 750 ක් වුවද දේශන පැය 408.5 ක් පමණක් ඉටු කිරීමට සැලසුම් සකස් කර දේශන පැය 399 ක් පමණක් පවත්වා තිබුණි.

(iv) යුනානි අධ්‍යයන අංශයේ අධ්‍යයන දෙපාර්තමේන්තු 02 ක විෂයයන් 05 ක් සඳහා වූ දේශන සැලසුම් විගණනය වෙත ඉදිරිපත් නොවීමෙන් එම දේශන පැවැත්වීමේ ප්‍රගතිය තහවුරු කරගත නොහැකි විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිසුන්ගේ අධ්‍යාපන කුසලතාවය වැඩිදියුණු කිරීම හා ඇගයීම පිණිස ශිෂ්‍යත්ව ප්‍රදානයන් කිරීම සඳහා 1992 සිට 2010 කාලය අතර බාහිර පාර්ශව පහක් විසින් ලබා දුන් පරිත්‍යාග උපයෝගීකර ගනිමින් ගොඩනැගූ අරමුදල් පහකින්, ශිෂ්‍යත්ව ප්‍රදානය කර නොතිබූ අතර 2012 දෙසැම්බර් 31 දිනට එහි වටිනාකම රු.227,755ක් වී තිබුණි. රු.10,100 ක් වූ අරමුදලකට අදාළ තොරතුරු ආයතනය සතුව නොතිබූ අතර එම මුදල ආයෝජනය කර ද නොතිබුණි.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 1995 පෙබරවාරි 11 වන දින ආයතනය වෙත භාර දෙනු ලැබූ කාමර 28 ක් සහිත ගොඩනැගිල්ලක පවත්වාගෙන එනු ලබන පිරිමි නේවාසිකාගාරය, නේවාසිකාගාරයකට සුදුසු පරිදි වැඩිදියුණු කර නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ දීමනා ලබන 67 දෙනෙක් වූ මුළු කථිකාචාර්ය හා සහාය කාර්ය මණ්ඩලයේ 47 දෙනෙකු පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණ ද ඒ පිළිබඳව අවධානයට යොමු නොකර පර්යේෂණ දීමනා ගෙවමින් තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව, ලංසු ඇපකර හා කාර්ය සාධන ඇපකර ලබාගැනීමකින් ද සැපයුම්කරුවන් සමඟ ලිඛිත ගිවිසුම්වලට එළඹීමකින් ද කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් ද තොරව සමාලෝචිත වර්ෂය තුළ දී ක්‍රීඩා පිටිය වැඩි දියුණු කිරීම සඳහා රු.573,832 ක් වටිනා පස් කියුබ් 192 ක් මිලදී ගැනීම සහ ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ ශිෂ්‍ය අධ්‍යයන කටයුතු සඳහා රු.2,431,360 ක් වටිනා යන්ත්‍ර 05 ක් මිල දී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පස් මිල දී ගැනීම

------------------

(i) ඇස්තමේන්තු සකස් කර නොතිබීම.

(ii) ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයීම් කමිටුව පත් කිරීම, එම කමිටු රැස්වීම, මිල ගණන් විවෘත කිරීම, පස් කියුබ් 300 ක් ඇණවුම් කිරීම යන සියලු කාරණා 2012 මාර්තු 16 දින සිදුකර, එදිනට පෙර භාණ්ඩ භාර දිය යුතු බවට ද ඇණවුමෙහි සඳහන් කර තිබීම.

(iii) ආයතනයට ආසන්නම තැපැල් කාර්යාලයේ අංක 7818 සිට 7821 දක්වා වූ අංක යටතේ ලියාපදිංචි කරන ලද මිල ගණන් 04 ක් 2012 මාර්තු 17 දින ආයතනයට ලැබී තිබූ නමුත් 2012 මාර්තු 16 දින මිල ගණන් විවෘත කර තිබීම.

(iv) පස් රැගෙන ඒම අධීක්ෂණය කර නොතිබීම හා තාක්ෂණික නිලධාරියෙකුගේ සහතිකයකින් තොරව පස් සපයන අතරතුර ගෙවූ රු.300,000 ක් ඇතුළුව පස් කියුබ් 147 ක් සඳහා රු.440,640 ක් ගෙවා තිබීම.

(v) පස් සපයන අතරතුරදීම පස් කියුබ් 148 ක් තුනී කිරීම සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරුට තාක්ෂණ නිලධාරියෙකුගේ සහතිකයකින් තොරව රු.42,960 ක් ගෙවා තිබීම.

(vi) එම පස් සැපයුම්කරුටම පස් කියුබ් 55 ක වෙනත් ඇණවුමක් ලබා දී , එම සැපයීම පිළිබඳව අධීක්ෂණයකින් ද තොරව රු.133,192 ක් 2012 ඔක්තෝබර් මස ගෙවා තිබීම.

(ආ) යන්ත්‍ර මිල දී ගැනීම

-----------------------

ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ ශිෂ්‍ය අධ්‍යයන කටයුතු සඳහා යන්ත්‍ර 6 ක අවශ්‍යතාවය වෙනුවෙන් යන්ත්‍ර පිරිවිතර ඇතුළත් තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ලැබීමටත් පෙර යන්ත්‍ර 10 ක් මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවා අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතන දෙකක් තෝරාගෙන තිබූ නමුත් එම ආයතන දෙකෙන් එක් ආයතනයක් 2011 අගෝස්තු 01 දින ලබා දුන් මිළ ගණන් සමඟ, එම මිළ ගණන් කැඳවීමට දින 5 කට පෙර ආයතනයේ නිලධාරියෙකු අමතා ලබාදුන් මිල ගණන් ඇතුළත් ලිපියක් ද තිබූ අතර අනෙක් ආයතනය ටෙන්ඩර් විවෘත කිරීමෙන් පැය 1 ½ කට පසු මිල ගණන් ලබා දී තිබුණි.

එසේම 2011 සැප්තැම්බර් 02 දින ප්‍රසම්පාදන කමිටුව මිලදී ගැනීම අනුමත කළ ද තාක්ෂණික ඇගයීම් කමිටුව එය නිර්දේශ කර තිබුණේ 2011 සැප්තැම්බර් 19 දින දී වන අතර එම ආයතන දෙකෙන් පිළිවෙළින් රු.801,360 ක් වටිනා යන්ත්‍ර 03 ක් සහ රු.1,630,000 ක් වටිනා යන්ත්‍ර 02 ක් මිල දී ගෙන තිබුණි.

4.4 හඳුනාගන්නා පාඩු

වසර 2 කට පෙර අළුත්වැඩියාව සඳහා භාරදුන් අන්වීක්ෂ (Microscope) 04 ක් අස්ථානගත වී තිබුණි.

4.5 අරමුදල් ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාසික සාමාන්‍ය වියදම රු.235,147 ක් වූ පශ්චාත් උපාධි මුදල් පොතෙහි රු.1,326,751 ක මාසික සාමාන්‍ය මුදල් ශේෂයක් පවත්වා ගෙන ගොස් තිබූ අතර 2012 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.1,331,182 ක් වී තිබුණි.

(ආ) 2011 ආයුර්වේද වෛද්‍ය ප්‍රදර්ශනයේ ලැබීම් හා ගෙවීම් සඳහා අනුමැතියකින් තොරව ලෝක සෞඛ්‍ය සංවිධානයේ රු.664,820 ක ශේෂයක් සහිත වසර කිහිපයක සිට නිෂ්ක්‍රීයව පැවති බැංකු ජංගම ගිණුම යොදා ගැනීමෙන් අනතුරුව ශේෂ වූ රු.122,469 ක් 2012 පෙබරවාරි සිට ගිණුමේ නිෂ්ක්‍රීයව තිබූ අතර එම ජංගම ගිණුම නියෝජනය වන ලෙජර් ගිණුමේ ශේෂය රු.236,004 ක් වූයෙන් රු.113,535 ක මුදල් ඌනතාවයක් නිරීක්ෂණය විය.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට 218 ක් වූ අනුමත මුළු කාර්ය මණ්ඩලයෙන් තනතුරු 55 ක් පුරප්පාඩු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍යසේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අධ්‍යයන හා සහාය කාර්ය මණ්ඩලය | 114 | 91 | 23 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 104 | 72 | 32 |
| | 218 | 163 | 55 |

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2010 - 2015 කාලය සඳහා වූ ආයතනයේ සංයුක්ත සැලැස්ම චක්‍රලේඛ ප්‍රකාරව කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2012 මැයි 15 දින අනුමත කරන ලද 2012 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි භෞතික ඉලක්කයන් හා සමහර කාර්යයන්ට අදාළ ඇස්තමේන්තුගත වියදම් දක්වා නොතිබීමෙන් අයවැය ලේඛනය සමඟ සමගාමී බවට පරීක්ෂා කළ නොහැකි විය. සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් වූ කාර්යයන් 06 ක් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවීමට හේතුන් තහවුරු නොවූ අතරම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් 09 ක් ක්‍රියාත්මක කිරීමට ද නොහැකි වී තිබුණි.

(ආ) 2003 ජූනි 12 දිනැති පීඊඩී 12 චක්‍රලේඛයේ 4.2.2 වගන්තියේ උපදෙස් පරිදි මාසික කාර්යය සාධන වාර්තා කළමණාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර 4.2.6 වගන්තිය පරිදි රේඛීය අමාත්‍යාංශයට හා භාණ්ඩාගාරයට යැවිය යුතු කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යය සාධන වාර්තා ද සකස් කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

---

අයවැයගත ප්‍රතිපාදනය රු.25,000,000 ක් වූ විෂයයන් 03 ක් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවීමද, ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇස්තමේන්තුගත වටිනාකම රු.31,100,000 ක් වූ විෂයයන් 03 ක් සඳහා අයවැයගත ප්‍රතිපාදනය රු.14,200,000 ක් වීම සහ රු. 40,000,000 ක් වූ මුළු අයවැයගත ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් රු.31,900,000 ක් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හේතුවෙන් 2012 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම, අයවැය ලේඛනය හා සමගාමී නොවූ අතර වියදම් දැරීමේදී ද ඊට අනුගත වී නොතිබුණි.

5.4 අයවැය පාලනය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 12 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය අනුව අයවැය ලේඛනය සමඟ අයවැයගත ආදායම් ප්‍රකාශනය, ශේෂපත්‍රය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු අයවැයගත ආදායම රු.8,900,000 ක් වන අතර සත්‍ය ආදායම රු.4,609,208 ක් විය. එය සියයට 48 ක අඩුවීමකි. එමෙන්ම සේවක පාරිශ්‍රමික, ගමන් වියදම් සහ සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය යන වැය විෂයන්හි ඇස්තමේන්තුගත වියදම රු.132,500,000 ක් වූ නමුත් සත්‍ය වියදම රු.139,516,415 ක් විය. එය ඇස්තමේන්තුගත වියදමින් සියයට 5.3 ක ඉක්මවීමකි. තවත් වැය විෂයයන් දෙකක අයවැයගත ප්‍රතිපාදනය

රු.12,100,000 ක් ද සත්‍ය වියදම රු.4,387,898 ක් ද වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබූ අතර පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද 2010 හා 2009 වාර්ෂික වාර්තා සමඟ ආයතනයේ අවසන් ගිණුම් ඇතුළත් කර ද නොතිබුණි.

6. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ලේඛන පැවැත්වීම
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) ස්ථාවර වත්කම් නඩත්තුව
(ඉ) ගබඩා පාලනය
(ඊ) අත්තිකාරම් ලබාදීම
(උ) කාර්යය සාධනය හා අධ්‍යයන කටයුතු
(ඌ) ප්‍රසම්පාදන කටයුතු
(එ) අයවැය පාලනය
(ඒ) සැලසුම් සකස් කිරීම
(ඔ) කොන්ත්‍රාත් පරිපාලනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට පිළිතුරු**

2.2.1

(අ) 2011 වසරේදී ගිණුම්කරණ පැකේජයට දත්ත ඇතුලත් කිරීමේ දී සිදු වූ දෝෂයක් හේතු කොටගෙන මෙම තත්ත්වය ඇති වී තිබෙන අතර 2012 වර්ෂයේ දී අදාල දෝෂය නිවැරදි කිරීමට කටයුතු යොදන ලද නමුත් 2011 වර්ෂයේ සිදු වූ දෝෂයෙන් පැන නගින 2012.01.01 දෝෂ සහිත ශේෂය තව දුරටත් පවතී. 2012 වර්ෂය තුල ගැලපීම් සිදුකර ඇති බැවින් 2013 වර්ෂයේ දී මෙම තත්ත්වය නිවැරදි වනු ඇත.

(ආ) මෙම පාඨමාලාවට අදාල වෙනත් වියදම් තිබේද නැද්ද යන්න සොයා බලා අදාල මුදල් සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

(ඈ) පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

(ඉ) මේවන විට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුවන අතර එම කටයුතු අවසන් වීමෙන් පසුව රජයේ තක්සේරුකරු මගින් ඵලදායි ජීවිත කාලය ලබා ගෙන අදාල නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ඇත.

(ඊ) පාරිභෝජන භාණ්ඩයක් නොවන බැවින් පස් මිල දී ගැනීම සඳහා ගෙවීම් කිරීම පුනරාවර්ථන ගිණුමෙන් සිදු කළ නොහැකි නිසා ප්‍රාග්ධන ගිණුමෙන් ගෙවීම කර ඇත. කෙසේ වෙතත් පස් සඳහා වැය වූ වියදම ඉඩමේ වටිනාකමට එකතු කිරීම ද ප්‍රායෝගික නොවන බැවින් අදාල මුදල් විගණනය විසින් පෙන්වා ඇති පරිදි ආදායම් වියදම් ගිණුමට ගලපා ඇත.

(උ) මුදල් කමිටුවේ නිර්දේශය හා කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව අදාල ශේෂයන් ලියා හැර නිවැරදි ගිණුම් ශේෂය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

(ඌ) පරීක්ෂා කර බලා නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත.

2.2.2 පරීක්ෂා කර බලා නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත.

2.2.3 සේවය අවසන් වීමෙන් පසු ණය ශේෂයන් පමණක් අය කර ගනු ලබන අතර හිඟ පොළිය අය කිරීමක් සිදු කරනු නොලැබේ. අයවිය යුතු ණය පිළිබඳව කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරනු ඇත.

2.2.4 අදාල උපලේඛණ පිළියෙල කිරිමට කටයුතු කරමින් සිටී.

2.2.5

(අ) I අදාළ සියලුම අනුමත කිරීම් හා සහතික කිරීම් කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව සිදු කර ඇත.

II පෙන්වා ඇති වවුචර්පත් වල චෙක්පත් නිකුත් කිරීමේ දී වවුචරයේ අදාල ස්ථානයේ අත්සන් තබා අදාල පුද්ගලයින් විසින් චෙක්පත් රැගෙන ගොස් ඇත. එක් වවුචර් පතකට අදාල ආයතනයක් මුද්දර ගාස්තු සමථයකට පත් කර ගැනීම සඳහා 2006 අංක 12 දරණ මුද්දර මුද්දර ගාස්තු විශේෂ විධි විධාන පනත යටතේ ලියාපදිංචි වී ඇත. කෙසේ වෙතත් ඉදිරියේ දී අදාල ගෙවීම් ලබා ගැනීමේ දී නියමිත මුද්දර ගාස්තු සමඟ රිසිට් පත් ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීමේ ලේඛන පවත්වාගෙන යාමක් සිදු නොවන අතර එය සමස්ථ විශ්ව විද්‍යාල පද්ධතිය තුලම සිදුවන්නකි.

3.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

(අ) නිතීඥවරුන් විසින් පැමිණිල්ලට එරෙහිව සිය විත්ති වාචිකව ඉදිරිපත් කරන අවස්ථා වල දී නඩු ගාස්තු වලට යටත්ව නඩුව නිෂ්ප්‍රභා කරන ලෙස වැඩිමනක් සහන ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇතත් ගරු අධිකරණය තීන්දුව දෙන අවස්ථාවේ දී ඒ පිළිබඳව සඳහන් කර නොමැති වීම නිසා එලෙස පැමිණිලි පක්ෂයෙන් නඩු ගාස්තු අයකර ගැනීමට හැකියාවක් ලැබී නැත.

(ආ) ඉදිරි අවසන් ගිණුම් පිළියෙල කිරීම් වලදී මෙවන් තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කිරීමට පියවර ගනු ඇත.

4.1

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ඉහළ යාම හා භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යාම මත ඒක ශිෂ්‍ය පිරිවැය වැඩි වී ඇත.

(ආ,ඇ) නව විශය නිර්දේශ සකස් කිරීමත් සමඟ මෙම තත්ත්වය සැලකිය යුතු ප්‍රමාණයෙන් අඩු වී ඇති අතර ඉදිරියේ දී මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ඇත.

(ඇ) I,II.III.IV

ආයතනයේ කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර ස්ථිර කරන ලද යෝජනා ද සහිතව මෙම තත්ත්වට වෙනස් කිරීමට කටයුතු කරනු ඇත.

4.2 **කළමණාකරණ අකාර්යක්ෂමතා**

(අ) 1992 සිට 2010 කාලය අතර බාහිර පාර්ශව පහක් විසින් ලබා දී ඇති පරිත්‍යාග වලින් දැනටමත් ශිෂ්‍යත්ව දෙකක් ලබා දෙන අතර එක් පරිත්‍යාගයක් ශිෂ්‍යත්ව ලබා දීම සඳහා නොව පුස්තකාලයට පොත් ලබා දීම සඳහා අරමුණු කර ඇත.

එසේම ඉතිරි ශිෂ්‍යත්ව දෙක පිළිබඳව වැඩි විස්තර ආයතනය සතුව නොමැති අතර ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ආ) මෙම පිරිමි නේවාසිකාගාරය අයත් ඉඩම් ආයතනය සතු නොවන අතර එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් එකකි. දැනටමත් මෙම ඉඩමේ අයිතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එහි නව නේවාසිකාගාරයක් ඉදිකිරීමට එකඟ වී ඇත.

(ඇ) මෙම තත්ත්වය ආයතනයේ කළමණාකරණ මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඉදිරි කාලය තුල දී වෙනස් කිරීමට කටයුතු කරනු ඇත.

4.3

(අ,ආ) විශේෂ කමිටුවේ උපදෙස් පරිදි මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා වාර්තාව කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර එහි නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

4.4 මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනු ඇත.

4.5

(අ) ඉදිරියේ දී අදාල අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට පියවර ගනු ඇත.

(ආ) මෙම මුදල් සම්බන්ධව වාර්තාවක් මුදල් කමිටුවට ඉදිරිපත් කර සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට ක්‍රියා කරනු ඇත.

4.6 දැනටමත් මෙ සඳහා විභාග හා සම්මුඛ පරීක්ෂණ පවත්වා පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත.

5.1 2012 වර්ෂයේ මුල් කාලයේ දී මෙම ආයතනයේ පරිපාලන තනතුරුවල වෙනසක් සිදු වූ අතර කලින් සිටි පරිපාලනය මගින් එය යාවත්කාලීන කිරීම සිදු කර නොතිබුණි. එසේ වුවත් නව පරිපාලනය විසින් එය යාවත්කාලීන කර 2013 – 2017 නව සංයුක්ත සැලැස්ම සකස් කර 2013 වර්ෂය ආරම්භ වීමට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

5.2 ක්‍රියාකාරි සැලැස්ම

(අ) 2012 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර තිබූ කාර්යයන්ට අදාල භෞතික ඉලක්කයන් අදාල මාස අනුව ඒ ඒ මාතෘකා ඉදිරියෙන් දක්වා ඇති අතර සමහර කාර්යයන්ට අදාල මූල්‍ය ඉලක්කගත සංඛ්‍යාවන් දක්වා නොතිබුනේ ඇතැම් කාර්යයන් එය මුලින් දක්වා ඇති ප්‍රධාන කාර්යට සම්බන්ධ වීම නිසා ය. 2010 – 2015 සංයුක්ත සැලැස්මේ අතුලත් වූ අතැම් කාර්යයන් 2012 වසරේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් නොවීමට හේතු වී ඇත්තේ වඩාත් වැදගත් හා ප්‍රමුකත්වය දිය යුතු කාර්යයන් 2012 ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ දී සලකා ඇති බැවිනි.

2012 වර්ෂයේ අධ්‍යයන හ අනධ්‍යයන කාර්ය මණ්ඩල වල වැඩ වර්ජන හේතුවෙන් මාස 05 ක් පමණ ආයතනයේ සාමාන්‍ය කටයුතු වලට බාධා සිදු වූ අතර ඒ අනුව 2012 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් සියලු කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එම නිසා වඩාත් වැදගත් හා අත්‍යවශ්‍ය කාර්යයන්ට ප්‍රමුඛත්වය දීමට සිදු විය.

(ආ) 2013 වර්ෂයේ සිට අධ්‍යයන අංශයන්ගේ මාසික ප්‍රගතිය කළමණාකරණ මණ්ඩලයට වාර්තා වන අතර කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්සයය සාධන වාර්තා උසස් අධ්‍යාපන අමත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර ඇත.

5.3 අයවැය ඇස්තමේන්තු හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරනුයේ පෙර වර්ෂයේ අවසානයේ වන අතර මුදල් වෙන් කරීම් සිදු කරනුයේ අදාල වර්ෂයේ ජනවාරි මාසයේ ය. එහි දී ප්‍රසම්පාදන සැලසුමේ ඇති සියලු කාර්යයන් සඳහා මුදල් වෙන් කිරීම් නොලැබෙන අතර මුදල් වෙන් කිරීම් ලැබෙන කාර්යයන් අතරින් ප්‍රමුඛතාවය අනුව එම කාර්යයන් ඉටු කරනු ලැබේ. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මේ ඇති සියලු කාර්යයන් ඉටු කල නොහැකි තත්ත්වයක් ඇති වේ.

5.4

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දෙන උපදෙස් අනුව අයවැය ලේඛන පිළියෙල කරනු ලැබේ. කෙසේ වෙතත් 2014 අයවැය ලේඛන සැකසීමේ දි විගණන උපදෙස් කෙරෙහි ද අවධානය යොමු කරමින් වඩා නිවැරදි අයවැය ලේඛණයක් සකස් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) අයවැයගත අදායම හා සත්‍ය ආදායම අතර සැලකිය යුතු වෙනස්කම් තිබෙන බව පිළිගනු ලබන අතර ඉදිරියේ දී අදාල දත්ත විශ්ලේෂණය හා පුරෝකථනය කිරීමෙන් පසු වඩාත් තාත්වික ආකාරයෙන් අදායම් ශීර්ෂ යටතේ අදායම් හඳුනාගෙන අයවැය ලේඛන සකස් කිරීමට පියවර ගනු ඇත.

වරින්වර සිදුකරන ලද වැටුප් වැඩිවීම හා ඒ සම්බන්ධව වූ අනෙකුත් වියදම් එනම් අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල්, බාහිර කථිකාචාර්ය ගෙවීම්, විභාග ගාස්තු හා ගමන් වියදම් වැඩිවීම හේතුවෙන් සේවක පරිශ්‍රමික හා ගමන් වියදම් වැඩි වී ඇති අතර වෙළඳපල භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහල යාම හේතු කොටගෙන හා අයවැය සකසන අවස්ථාව වන විට හඳුනා නොගත් එහෙත් අත්‍යවශ්‍යයෙන්ම කලයුතු කාර්යයන් ඉටු කිරීම හේතු කොට ගෙන සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය වියදම් වැඩි වී ඇත.

වර්ෂය මුල දී අයවැය සකස් කරන අවස්ථාව වන විට සැලසුම් කරන ලද එහෙත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ හා ඒ වන විට අදාල කාර්යයන් අවශ්‍ය නොවන බවට තීරණය කිරීම යනා දී කාරණා හේතු කොටගෙන වැය විෂයයන් දෙකක සත්‍ය වියදම අඩු වී ඇත.2014 වර්ෂය සඳහා අයවැය ලේඛන සකස් කරන විට මෙම තත්ත්වයන් සැලකිල්ලට ගැනීමට ක්‍රියා කරනු ලැබේ.

5.5 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2011 වාර්ෂික වාර්තාව ආයතනයේ අවසන් ගිණුම් ද ඇතුළත්ව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

6. අදාල උපදෙස් පරිදි කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

18.12.2013

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
රාජගිරිය